# ප්‍රජාශක්ති

## දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් කලාපය 2022

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4

කාසල් වීදිය

කොළඹ 08

# ප්‍රජාශක්ති

## දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් කලාපය

## 2022


**සංස්කරණය**

**පී.ඒ.සී. ජයසිංහ**

**(පුහුණු හා පර්යේෂණ නිලධාරි)**



**ප්‍රකාශනය**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4, කාසල් වීදිය

කොළඹ 08

දුරකථන අංක- 0112 695579, 112 678203

ෆැක්ස්- 0112 696592

ඊමේල්- slrdtri@gmail.com

# ප්‍රජාශක්ති

## දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් කලාපය

## 2022

**උපදේශකත්වය**

ටී.ඒ. රණසිංහ

අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්ලිව්. ජී.පී.වේරවැල්ල

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කරණය**

පී.ඒ.සී. ජයසිංහ

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**පිටකවරය**

එන්.එම්.එම්. පියුමි කෝසලා වීරසූරිය

**ප්‍රකාශනය**

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4, කාසල් වීදිය

කොළඹ 08

**ජනාධිපති**

**අතිගරු රනිල් වික්‍රමසිංහ**

**මැතිතුමාගේ පණිවිඩය**



සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවතින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් සංවර්ධන ක්ෂේත්‍රයට ඉටු කරනු ලබන මෙහෙය පිළිබඳ ජනාධිපතිවරයා වශයෙන් මා අතිශය සතුටු වෙමි.

විශේෂයෙන් 1978 වසරේ එම ආයතනය මගින් ශ්‍රී ලංකාවට සමාජ සජීවිකරණ වැඩසටහන තුළින් හඳුන්වා දුන් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය එදා මෙදා තුර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලත් දේශීය හා විදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලටත් විශිෂ්ඨ ලෙස යොදගෙන ඵලදායිතාවය ඉහල නංවාගෙන ඇත.

වර්තමාන සමාජ ආර්ථික ප්‍රශ්න - ගැටළු හා අර්බුද පිළිබඳ සළකා බලන විට ජනතාවගේ චින්තනය පිළිබඳ පෙරළියක් සිදුකරන සමාජ සජීවිකරණ වැඩසටහන ඉහළ කාලීන අගයකින් යුතු වග සඳහන් කල යුතුව ඇත.

අප රටේ දිළිඳුබව අවම කරලීමේ සියළුම වැඩසටහන් සඳහාත්, වෙනත් සංවර්ධන වැඩසටහන් සඳහාත් ගතවූ දශක හතරකට ආසන්න කාලය තුළ මෙම ක්‍රමවේදය ගලපා තිබීම පිළිබඳ මා අතිශයින් සතුටු වෙමි. දුප්පත් පවුල් අතිවිශාල ප්‍රමාණයක් සංවර්ධන මාවතට යොමු කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගෙන ඇත. දිළිඳුකම පිටු දැකීමේ දිනය වෙනුවෙන් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය තව දුරටත් සමාජගත කිරීම සඳහා එම ක්‍රමවේදය පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රජාශක්ති සැමරුම් කලාපයක් ප්‍රකාශයට පත් කිරීම ඉතා කාලෝචිතය. එනිසා මෙම ක්‍රමවේදය ගලපාලමින් දිළිඳුකම පිටු දැකීමට අවශ්‍ය කාලය එළඹ ඇති හෙයින් දිළිඳුකම පිටුදැකීමට ශක්තිය හා ධෛර්ය මෙම ආයතනයට ලැබේවායි ප්‍රාර්ථනය කරමි.

**රනිල් වික්‍රමසිංහ**
**අතිගරු ජනාධිපති**

**අග්‍රාමාත්‍ය**

**ගරු දිනේෂ් ගුණවර්ධන**

**මැතිතුමාගේ පණිවිඩය**



ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පිහිටුවා දශක පහක් ඉකුත් වී ඇති අතර මෙම ආයතනය විසින් ආරම්භ කළ විපර්යකාරක වැඩසටහන ක්‍රියාත්මක වී වසර 44 ක් ගත වී ඇත.

ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳව අපට සතුටුවිය හැක්කේ ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් පමණි. රටේ දුප්පත්කමේ ගැටලුව සම්පූර්ණයෙන්ම ජය ගැනීම සඳහා අප මෙතෙක් සමත් වී නැත. දුප්පත්කම ජය ගැනීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් විවිධ වැඩසටහන් රට තුළ ක්‍රියාත්මක කර ඇත. එම වැඩසටහන් තුළින් විශාල ධනස්කන්දයක් ජනතාව අතරට ගෙන ගොස් ඇත. දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන්වල නිරත රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරින් සංඛ්‍යාවද පුලුල් වී ඇත. එසේ වුවත් සංවර්ධනයේ පැතිකඩක් වන දිළිඳුබවේ ගැටලුව දිගින් දිගටම සංකීර්ණ වෙමින් පවතී. සංවර්ධන වැඩසටහන්වලදී පුද්ගලයා හා පවුල අමතක කර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඊට හේතු වී ඇත. පුද්ගලයා හා පවුල තුල පරිවර්තනයක් ඇතිකරලීම තුළින් දිළිඳුකම අවම කළ හැකිය. පුද්ගලයා හා පවුල පරිවර්තනය කරමින් යහපත් රටක් ගොඩ නඟා ගැනීමට සුදුසු වැඩසටහන විපර්යකාරක වැඩසටහන බව පෙන්වා දිය හැකිය. විපර්යකාරක වැඩසටහන සඳහා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදාගෙන දිළිඳුකම පිටුදැකීමේ කාර්යයට සාර්ථකව දායක වී ඇත. දිළිඳුකම පිටුදැකීමේ දිනය වන ඔක්තොම්බර් 17 දිනය අප ආයතනය මෙන්ම අදාල අනෙකුත් රාජ්‍ය ආයතන නොයෙකුත් වැඩසටහන් සිදු කරමින් දිළිඳුකම පිටුදැකීමේ දිනය සිහිපත් කරනු ලබයි.

2022 වසරේදී දිළිඳුකම පිටුදැකීමේ දිනය සිහිපත් කරමින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය වැඩසටහන් ගණනාවක් සිදු කරමින් පවතින අතර “දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් ප්‍රජාශක්ති කලාපය” එළි දක්වා ඇත. එමගින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පිළිබඳ මනා දැනුමක් ඔබ වෙත ලැබෙන අතර ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් සඳහා එම දැනුම දායක කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනය කරමි.

**දිනේෂ් ගුණවර්ධන**

**ගරු අග්‍රාමාත්‍ය**



## සමාජ සවිබල ගැන්වීම්

## රාජ්‍ය අමාත්‍ය

## ගරු අනූප පැස්කුවෙල් අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාව අතීතයේ සිටම සංවර්ධන න්‍යාය පත්‍රයේ දිළිඳුකම අවම කරලීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. ඒ සඳහා රාජ්‍ය ආයතන ගණනාවක් දායක වන අතර සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයද විශාල මෙහෙවරක් දිළිඳුකම පිටුදැකීම උදෙසා සිදුකරනු ලබයි.

සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයද දිළිඳුකම පිටුදකිමින්, ග්‍රාමසංවර්ධනය සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමට දායක වන ප්‍රබල ආයතනයකි. මෙම ආයතනය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සඳහා පුහුණු , පර්යේෂණ හා ප්‍රකාශන යන අංශ තුළින් දිළිඳුකම පිටු දැකීම සඳහා දැනුම බෙදා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.

දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්විම උදෙසා මෙම ආයතනය වසර 44 ක් පුරා විපර්යකාරක වැඩසටහන තුලින් බිහිකළ නව සංවර්ධන ප්‍රවේශය අප රටේ දිළිඳුකම පිටු දැකීමට යොදාගත් ක්‍රමවේදය විය. එම ක්‍රමවේදය රටේ ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සඳහා ගලපා ගෙන දිළිඳුකම පිටුදැකීම උදෙසා විශාල මෙහෙවරක් සිදු කර ඇත.

එම ක්‍රමවේදය පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා ප්‍රකාශන එළි දැක්වීම තුළින් මෙම ආයතනය මහගු මෙහෙවරක් සිදුකර ඇති අතර අගෝස්තු 17 දින සිහිපත් කරනු ලබන “දිළිඳුකම පිටු දැකීමේ දිනය” වෙනුවෙන් මෙවර ප්‍රකාශයට පත් කර ඇති ප්‍රජාශක්ති සැමරුම් කලාපය තුලින්ද ප්‍රජාව සවිබලගැන්වීමට අවශ්‍ය වටිනා දැනුම ජනතාව අතට පත් කර ඇත. එබැවින් නව සංවර්ධන ප්‍රවේශය ගලපාලමින් අප රටේ දිළිඳුකම පිටු දැකීමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට ලැබේවායි සුභාශිංසනය කරමි.

**අනූප පැස්කුවෙල්**

**සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍ය**

# සංස්කාරක සටහන

නිදහසින් පසු  වසර 74 ක ගමන් මග තුළ මෙරට බහුතර අඩු ආදායම්ලාභීන් දිළිඳු බවින් මුදා ගැනීම සඳහා රට පාලනය කළ සියළු රජයන් බොහෝ උත්සාහයන් දරා ඇත. එසේ වුවත් බලාපොරොත්තු වූ ප්‍රතිඵලයන් ලබා ගත නොහැකිව සෑම පුරවැසියෙක්ම විශාල ණය කරුවන් බවට පත් වි ඇත.  දිළිඳු ප්‍රජාව සජීවීව සංවර්ධනය සඳහා සහභාගි නොකරගෙන ඉහළ සිට පහළට දිවෙන සම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශයන් යොදා ගැනීම  එයට හේතු වූ කරුණක් විය.

දිළිඳුකම පිටුදැකීම  සඳහා ශක්තිමත් සුවිශේෂී නව සංවර්ධන ක්‍රමවේදයක් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් 1978 වසරේදී හඳුන්වා දී ඇත. එය මෙරට සංවර්ධන ක්ෂේත්‍රයට හඳුන්වා දුන් සමාජ සජීවීකරණ වැඩසටහන  හෙවත් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය විය. මෙම ක්‍රමවේදය අඩු - වැඩි වශයෙන් භාවිතා කරමින් වසර 44 ක් පුරා අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබලගන්වමින් දිළිඳුකම අවම කිරීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය තුළින් බිහිවූ ප්‍රජාශක්ති සංවිධාන මෙන්ම  රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන රැසක් සමත් වී ඇත.

මෙම ක්‍රමවේදය තුළින් තම පවුලෙත්, ගමෙත්, රටෙත් සංවර්ධනයට බාධා කරන අවාසිදායක සමාජ ආර්ථික බලවේගයන් ගැඹුරින් හඳුනාගෙන ඒවාට එරෙහිව සංවිධානය වී සාමූහික ක්‍රියාකාරකම් තුළින් විසඳුම් සෙවීමට කටයුතු කිරීම සිදු වේ. මෙය පහසු කටයුත්තක් නොවන අතර පරම්පරා ගණනාවක් පැවති ඍණ ආල්පවල එල්බගෙන සිටින පිරිස් ධනාත්මක ආකල්පමය වෙනසක් ඇතිකර සාමූහික ක්‍රියාදාමයකට යොමු කර ගැනීම අතිශය දුෂ්කර කටයුත්තකි. එය ඉටු කර ගත හැක්කේ සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය තුළිනි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හැදෑරූ නිර්මාණශීලි, සුවිශේෂී ගති ලක්ෂණ ඇති  මැදිහත්කරුවන් පුහුණු කර මෙම ක්‍රමවේදය ව්‍යාප්තකර සංවර්ධන අභිලාෂී ප්‍රජාව සවිබල ගන්වා දිළිඳුකම පිටු දැකීම ප්‍රධාන අරමුණ වේ.  ඒ සඳහා  ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පුහුණු, පර්යේෂණ හා ප්‍රකාශන යන අංශ ඔස්සේ එම මෙහෙවර ඉටු කරනු ලබයි. ඒ අනුව මෙවර දිළිඳුකම පිටුදැකීමේ දිනය සිහිපත් කරමින්  දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් ප්‍රජාශක්ති සඟරාව එළි දක්වා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ජන ගත කිරීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන අංශය අපේක්ෂා කරයි. මෙම කෘතියට ලිපි සපයමින් ඒ සඳහා දායකත්වය ලබාදුන් විද්වත් ලේඛකයින් පිරිස මෙම අවස්ථාවේ ප්‍රශංසනීයව අගය කරමි.

**සංස්කාරක**

# ලේඛණාවලි - ලේඛකාවලි

**01.** **ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා නොවිධිමත් අධ්‍යාපනය**

**පීටර් ඩයස් අමරසිංහ**

හිටපු ලේකම්

ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය.

**02.** **විපර්යකාරක වැඩසටහනේ ආරම්භය හා විකාශනය.**

**ඩබ්.ඩී.එන්. වීරසූරිය**

ශාස්ත්‍රපති ( සමාජ විද්‍යාව)

ජ්‍යොෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

**03.** **විපර්යකාරක වැඩසටහනේ පුරෝගාමීන්.**

**ජී.ජී.එස් බණ්ඩාර**

විද්‍යාවේදි විශේෂ ( සත්කාර සේවා කළමනාකරණය)

ජ්‍යොෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

**04.** **විපර්යකාරක වැඩසටහනේ කාලීන වැදගත්කම.**

**ඩබ්ලිව්සිරිසේන .එච්.**

ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව)

ජ්‍යොෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

**05.** **විපර්යකාරක වැඩසටහන වර්තමානයේ මුහුණපාන අභියෝග.**

**ආචාර්ය ඒ.එම්.එස් අතපත්තු**

දර්ශනශූරි (සමාජ සංවර්ධනය)

ජ්‍යොෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# පටුන

පිටු අංක


01. ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා නොවිධිමත් අධ්‍යාපනය - පීටර් ඩයස් අමරසිංහ 01 - 07

02. විපර්යකාරක වැඩසටහනේ ආරම්භය හා විකාශය. - ඩබ්.ඩී.එන්. වීරසූරිය 08 - 14

03. විපර්යකාරක වැඩසටහනේ පුරෝගාමීන්. - ජී.ජී.එස් බණ්ඩාර 15 - 17

04. විපර්යකාරක වැඩසටහනේ කාලීන වැදගත්කම.

- ඩබ්ලිව්.එච්. සිරිසේන 18 - 21

05. විපර්යකාරක වැඩසටහන වර්තමානයේ මුහුණපාන අභියෝග.

-ඒ.එම්.එස් අතපත්තු 22 - 31

# ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා නොවිධිමත් අධ්‍යාපනය.

පීටර් ඩයස් අමරසිංහ
හිටපු ලේකම්, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය.

## 1.0 පූර්විකාව.

රාජ්‍ය නොවන මූල්‍ය ආයතන කිහිපයක් නිසා ක්ෂුද්‍ර මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් කාන්තාවන් 75,000 කට පමණ පිහිටවීමට පසුගිය රජයට (2015-2020) සිදු විය. ණය ආපසු ගෙවා ගැනීමට නොහැකි වීම නිසා කාන්තාවන් 168 දෙනෙක් පමණ සිය දිවි නසා ගත් බවක්ද මාධ්‍යය මගින් හෙළිදරව් කොට තිබුණි. එම සිද්ධිය ගැන දැනුවත් වීමත් සමග මගේ මතකයට ආවේ 1988 දී පමණ බණ්ඩාරවෙල පියරපන්දෝව නම් ගමේ එවකට තරුණ වියේ පසු වූ එළවලු ගොවියන් කිහිප දෙනෙකු සමග අප කළ සාකච්ඡාවකි. එම සාකච්චාව ට මා සමග ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සේවය කළ ග්‍රාම සංවර්ධන නිලධාරි මහතෙකු ද සහභාගි විය.

අප මුණ ගැසුණු එම ගොවීන් ඒ වන විට කුඩා කණ්ඩායම් ගත වී සිටි බව අප සමග කළ සාකච්ඡාවේ දි හෙළිදරව් විය. ඔවුන් කුඩා කණ්ඩායම් ගත වීමද බොහෝ ආස්වාද ජනක අන්දරයකි. එහෙත් එය පසුවට තබා අපේ මුඛ්‍ය කාරණයට අවතීර්ණ වෙමි.

ඔවුන් කණ්ඩායම් ගත වී ටික කලකින් ඌව පළාතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය නොවන සංවිධානයක් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා දැක කෙටි කාලීන ණය ලබා දීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ඇත. මුල් අවස්ථාවේ දී ඔවුන් ගොවීන්ට අවාසිදායක කොන්දේසි කිසිවක් ඉදිරිපත් නො කලෙන් එම ගොවීන්ගේ කුඩා කණ්ඩායම් තුල දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව **සම්මුතියකට එළඹීමෙන් පසු** එම ණය මුදල් ඔවුන් ලබා ගෙන ඇත. එමෙන්ම වගා කන්නය අවසානයේ තම නිෂ්පාදන අලෙවි කොට එම ණය මුදල් ආපසු ගෙවා අවසන් කොට ඇත. ඊළඟ කන්නය සඳහා ද එම රාජ්‍ය නොවන සංවිධානය ලබා දෙන ලද ණය සඳහා ගොවීන්ට අවාසි සහගත වන කොන්දේසි ඉදිරිපත් නො වුන හෙයින් එම ණය ද ලබා ගෙන නියමිත කාලය තුල ආපසු ගෙවා නිදහස් විය. තුන්වැනි අවස්ථාවේ දී ද ණය ලබා දීමට එම රාජ්‍ය නොවන සංවිධානය ඉදිරිපත් වුන ද ගොවීන්ට අවාසි සහගත කොන්දේසි ඉදිරිපත් වූ යෙන් එම ණය ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ශක්තිය තිබිණි. ඒ ඔවුන් ලද සහ ඒ වන විටත් ලබමින් තිබූ නොවිධිමත් අධ්‍යාපනයක් තුලින් ලැබූ දැනුම සහ පන්නරය නිසා සිදු වූවකි. ඒ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමවේදය කුමක් දැයි පසුව විස්තර කරමි.

ඊට පෙරාතුව නොවිධිමත් අධ්‍යාපනය යනු කුමක්දැයි හඳුනා ගැනීමට උත්සාහ කරමු. බොහෝ දෙනා දන්නා පරිදි අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ. එනම්:

- විධිමත් අධ්‍යාපනය (Formal Education);
- අවිධිමත් අධ්‍යාපනය (Informal Education); සහ
- නොවිධිමත් අධ්‍යාපනය (Non-formal Education) යනුවෙන්.

විධිමත් අධ්‍යාපනය යනු ප්‍රාථමික, ද්විතීය සහ තෘතීය යනුවෙන් සඳහන් වෙන, කිසියම් විෂය නිර්දේශයකට අනුගත වුනු, පිළිගත් ඉගැන්වීමේ ක්‍රම සහිත බොහෝ විට පන්ති කාමරයක් තුල සිදු වෙන අධ්‍යාපන කටයුත්තකි. වෙනත් විධියකට කියන්නේ නම් පාසල් අධ්‍යාපනය, සරසවි අධ්‍යාපනය සහ කාර්මික විද්‍යාල අධ්‍යාපනය වැනි දේ ගැනෙන්නේ විධිමත් අධ්‍යාපනය ලෙසයි. එහෙත්, බොහෝ අධ්‍යාපන කටයුතු වල විධිමත් මෙන් ම නොවිධිමත් අධ්‍යාපන ලක්ෂණ ද පැවතීමට ඉඩ ඇති හෙයින් ඉරක් ගසා එම දෙක වෙන් කර දැක්වීමට අපහසු වන අවස්ථා ද ඇත.

## 2.0 අවිධිමත් අධ්‍යාපනය.

විධිමත් අධ්‍යාපන ක්‍රම ගැන කෙටියෙන් හෝ සඳහනක් කළ හෙයින් අවිධිමත් අධ්‍යාපනය ගැනද මෙසේ සටහන් කරමි. නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය අතර ඇති ප්‍රධාන වෙනස නම්, නොවිධිමත් අධ්‍යාපනය යනු සම්ප්‍රදායික ඉගෙනුම් පන්ති කාමර සැකසුමෙන් පිටත සිදුවන ව්‍යුහගත සහ සැලසුම් සහගත අධ්‍යාපනික වැඩසටහන් වන අතර අවිධිමත් අධ්‍යාපනය යනු ඉගෙන ගන්නන්ට ඕනෑම තැනකදී ලැබිය හැකි ව්‍යුහගත නොවන සහ ආකෘති රහිත අධ්‍යාපනයකි. සමාජයේ නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපන ක්‍රම දෙකම ඉගෙන ගන්නන්ගේ කුසලතා වර්ධනයට දායක වේ. නොවිධිමත් අධ්‍යාපන ක්‍රමය සැලසුම් සහගත වැඩපිළිවෙලකට ඇලී සිටියද, අවිධිමත් අධ්‍යාපනය විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන ක්‍රම වල මෙන් දැඩි නීති රීති වලින් සමන්විත නොවේ.

## 3.0 නොවිධිමත් අධ්‍යාපනය.

නොවිධිමත් අධ්‍යාපනය ගැන ඉහතින් සඳහනක් කළද ලිපියේ මුඛ්‍ය අරමුණ එය ගැන කථා කිරීම වන හෙයින් ඒ ගැන ලියමි. නොවිධිමත් අධ්‍යාපනය යන්නට විවිධ පුද්ගලයින් විසින් විවිධ අර්ථකතන දිය හැක. සමහරුන්ට විධිමත් අධ්‍යාපනයට අයත් නොවන අනෙක් සියලු අධ්‍යාපන ක්‍රම නොවිධිමත් අධ්‍යාපනය යයි පෙනෙන්නට ඉඩ ඇත. ඒ විවිධ ක්ෂේත්‍ර සඳහා නොවිධිමත් අධ්‍යාපනය විවිධ අයුරින් ගලපා ගැනීමට ඉඩ ඇති හෙයිනි. සාමාන්‍යයෙන්, නොවිධිමත් අධ්‍යාපනය යොදා ගන්නේ වැඩිහිටි සාක්ෂරතා නැංවීමේ කටයුතු වලට, පාසල් හැර ගිය වුන් සඳහා වන මූලික අධ්‍යාපන වැඩසටහන්, ජීවන කුසලතා වැඩසටහන්, වැඩ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් වැනි අඛණ්ඩ අධ්‍යාපන කටයුතු වලටයි. එමෙන්ම ප්‍රජා සංවර්ධන සහ ග්‍රාම සංවර්ධන වැඩසටහන් වල දී ද නොවිධිමත් අධ්‍යාපනය බොහෝ රටවල් විසින් යොදා ගන්නා බව ප්‍රසිද්ධ කාරණයකි.

අධ්‍යාපනය ගැන ලියැවී ඇති දේ වලට අනුව නොවිධිමත් අධ්‍යාපනය කියල කියන්නේ විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් පරිබාහිර ව සිදු වන විධිමත් නොවන එහෙත් සංවිධිත අධ්‍යාපන කටයුත්තකි. එමෙන්ම නොවිධිමත් අධ්‍යාපනය නම්‍යශීලී සහ සහභාගී වන්නන් කේන්ද්‍රීය කොට ගත් අධ්‍යාපන ක්‍රමයක්. එක් එක් වාතාවරණයන්ට ගැලපෙන අයුරින් සකස් වෙන සහභාගිත්ව ක්‍රමවේදයක් මත පදනම් වන අධ්‍යාපන ක්‍රමයක් ලෙසත් නොවිධිමත් අධ්‍යාපනය හැඳින් විය හැකිය.. මේ සඳහා වූ විශේෂ ඉලක්ක කණ්ඩායමක් නැත. ඒ ළමයින් විය හැකිය. එසේත් නැත්නම් තරුණ අය හෝ වැඩිහිටියන් විය හැකිය.

ග්‍රාම සංවර්ධනයේ දී බොහෝ විට ඉලක්ක ගත වන්නේ තරුණ පිරිස් සහ වැඩිහිටියන් වේ. එහෙත් එක් එක් වැඩසටහනට එහි අරමුණු අනුව සහභාගි වන එසේත් නැත්නම් සහභාගී කර ගත යුතු කණ්ඩායම් වල සංයුතිය වෙනස් විය හැක. ග්‍රාම සංවර්ධනයේ දී බොහෝ විට එවැනි කණ්ඩායම් සමජාතීය කණ්ඩායම් වේ. මෙහි සමජාතීය යනුවෙන් අදහස් කරන්නේ සිංහල, දෙමල හෝ මුස්ලිම් කණ්ඩායම් ගැන නොවේ. එසේත් නැත්නම් බෞද්ධ හෝ හින්දු වැනි ආගම් මුල් කොටගත් සමජාතීයයන් ගැන ද නොවේ. සමජාතීය බව තීරණය වන්නේ මිනිසුන් නිරතවන ප්‍රධාන ආර්ථික කටයුත්ත පදනම් කර ගැනීමෙනි. උදාහරණයක් ලෙස ගොවීන්ගෙන් සමන්විත කණ්ඩායම් දැක්විය හැකිය.

නොවිධිමත් අධ්‍යාපනය තුලින් පුද්ගල සංවර්ධනයට අත දිය හැකි වන වාක් මෙන් ම පුද්ගලයින්ගේ වෘත්තීය හැකියා වන් ද වර්ධනය කළ හැක. එමෙන්ම පුද්ගල කණ්ඩායම් වල අවශ්‍යතා අනුව විෂය පථය වෙනස් කල හැකි වීමත් සමාජයේ සිදු වන වෙනස් වීම් වලට ගැළපෙන අයුරින් වැඩසටහන් සකස් කිරීමට හැකි වීමත් නොවිධිමත් අධ්‍යාපනයේ වාසි ලෙස දැක්විය හැකිය.

### 3.1 සාම්ප්‍රදායික නොවිධිමත් අධ්‍යාපනය.

විධිමත් අධ්‍යාපනයේ දී ළමුන් දැනුවත් කිරීම සඳහා වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් අවශ්‍ය වන්නා සේම අප කතා කරන නොවිධිමත් අධ්‍යාපනයේ දී ද අදාළ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විශේෂිත දැනුමක් ඇති පුද්ගල කණ්ඩායම් අවශ්‍ය වේ. උදාහරණ විධියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට අනුයුක්ත ව කටයුතු කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් වැනි ක්ෂේත්‍ර නිලධාරීනුත් එමෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි උපදේශකවරයන් වැනි අයත් දැක්විය හැක. මෙවැනි රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් **සාම්ප්‍රදායික නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්** ලෙස හඳුන්වමි. මම එහෙම කිව්වේ හේතු කිහිපයක් ඇතුව.

- ඉහතින් සඳහන් කරපු නිලධාරීන් ඒ කටයුතු වල නිරත වෙන්නේ ඒ ඔවුන්ගේ රාජකාරිය නිසා.
- ඔවුන් සියලු දෙනාම පාහේ ඒවා පවත්වන්නේ පුරුද්දකට සහ කාල සටහනකට.
- ඒ කාල සටහන් මිනිස්සුන්ට ගැලපෙනවද නැද්ද කියන එක ගැන ඔවුන්ගේ ඒ තරම් තැකීමක් නැහැ.
- ඒ බොහෝ අධ්‍යාපන වැඩසටහන් පවත්වන්නේ ඉහලින් ලැබෙන නියෝග සහ උපදෙස් අනුවයි.
- ඒ පවත් වන්නේත් නොවිධිමත් ලේබලය යටතේ වැඩිහිටි අධ්‍යාපන වැඩ සටහන්.
- බොහෝ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්වල මැදිහත් කරුවන් ජනතාව දැනුවත් කිරීම සඳහා උපයෝගී කර ගන්නේ සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රම බව ද පෙනෙන්නට තිබුන.

**ඉහතින් සඳහන් කළ කරුණු සියල්ලම පාහේ දිළිඳුකම පිටු දැකීමේ මුඛ්‍ය පරමාර්ථය කොට ගත් දැනට අවුරුදු 25 ක් පමණ තිස්සේ ක්‍රියාත්මක වන සමෘධි වැඩසටහනේ අධ්‍යාපනික වැඩසටහන් සඳහාද වලංගුවේ.** ඒ ගැන විස්තරාත්මක සාකච්ඡාවකට අවතීර්ණ වීම මේ අවස්ථාවේදී නොකළ යුතු යයි සිතෙන බැවින් එය පසුවට තබමි.

ඒ නිසා අප මේ ලිපියෙන් සුදානම් වන්නේ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමවේදයන් ග්‍රාම සංවර්ධනයට සහ ග්‍රාමීය දිළිඳු කම පිටු දැකීම සඳහා යොදාගත හැක්කේ කෙසේදැයි සාකච්චා කිරීමටයි. වෙනත් විධියකට කියනව නම් අපි මේ උත්සාහ කරන්නේ අපේ අරමුණට ගැලපෙන විකල්ප නොවිධිමත් අධ්‍යාපන ක්‍රමවේදයක් බිහි කර ගන්න. මේ ලිපිය රචනා කරන්නේ ලංකාවේ ක්‍රියාත්මක වුනු කාර්ය බද්ධ පර්යේෂණයක අත්දැකීම් ආශ්‍රයෙන්.

## 4.0 දිළිඳුකම පිටුදැකීම.

අද දිළිඳු කම පිටුදැකීමේ අවශ්‍යතාවය වෙනදාටත් වඩා දැනේ. ඒ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් දූප්පතුන් සූරාකන නිසාම නොවේ. බොහෝ ව්‍යසන සහ ආපදාවන් වලට ගොදුරුවන මිනිසුන් අතරින් වඩාත් පීඩාවට පත්වන්නේ දුප්පතුන් නිසාවෙනි. එය බොහෝ විද්වතුන් ද පිළිගන්නා කාරණයකි. දැනට මුළු ලෝකයම පීඩාවට පත් කොට ඇති කොරෝනා වසංගතය ද ආපදාවකි. කොරෝනාවේ පැතිරීමේ වේගය සහ ව්‍යාප්තිය සමග බොහෝ ජනයා දිළිඳු කමේ පතුලටම ඇදවැටෙන බවත් ලෝක බැංකු ඇස්තමේන්තු අනුව 2021 වසර අවසානය වන විට මිලියන 60 ක පමණ ජනතාවක් එසේ අන්ත දුගීන් ලෙස හඳුනා ගත හැකි වනු ඇති බවටත් ප්‍රකාශිතව තිබුණි.

දැනට රටේ පවතින අර්බුදය තුලින්ද ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් දිළින්දන් බවට පත් වෙන බවත් බොහෝ දෙනා පිළිගන්නා කාරණයකි. එහෙයින් ඕනෑම සංවර්ධන වැඩ සටහනක දිළිඳුකම පිටු දැකීම ප්‍රමුඛ කාර්යයක් වේ.

## 4.1 අතීත ග්‍රාම සංවර්ධන උත්සාහයන්.

දැන් අපි ග්‍රාම සංවර්ධනයට යොමු වෙමු. මෙහි දී අප ඉස්මතු කරලීමට උත්සාහ ගන්නේ දිළිඳුකම පිටු දැකීම සහ දිළින්දන් ගේ සවිබලවතනය (empowerment) මුඛ්‍ය අරමුණ කර ගත් ග්‍රාම සංවර්ධනයක් ගැනයි. ඒ වර්තමානයේ අන්තර්ජාතික මෙන් ම ජාතික මට්ටමේ දී ද සංවර්ධන වැඩසටහන් වල ප්‍රමුඛත් වය ලබා දිය යුතු එක කරුණක් ලෙස සඳහන් වන්නේ දිළින්දන් ගේ සවිබලවතනය තුලින් දිළිඳුකම පිටුදැකීම වන හෙයිනි.

අප රටේ ග්‍රාම සංවර්ධන ඉතිහාසය දෙස සුපරීක්ෂා කාරීව බැලුවොත් නිදහසින් පසු බිහි වූ දීපව්‍යාප්ත ව ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම සහ ඒ ආශ්‍රයෙන් ක්‍රියාත්මක කළ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය දිළිඳු කම පිටුදැකීම සඳහා කිසිදු අන්දමින් පිටිවහලක් වූයේ නැති බව පසක් වනු ඇත. එම වැඩසටහන් මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති බොහොමයක් භෞතික යටිතල පහසුකම් ඇති කිරීමේ ක්‍රියාකාරකම් වලට සීමා විණි. අදත් එවැනි වැඩසටහන් යම් මට්ටමකින් හෝ රට තුල ක්‍රියාත්මක වේ.

හැත්තෑව දශකයේ අග භාගයේ සිට දශක දෙකකට අධික කාලයක් රටේ දිළිඳු යයි හඳුනා ගත් දිස්ත්‍රික්ක දහයක පමණ විදේශ ආධාර මත දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති (IRDP) ක්‍රියාත්මක විය. ඒ IRDP තුල ක්‍රියාත්මක වුනේ එකිනෙකට සම්බන්ධ නැති ව්‍යාපෘති (development projects) සමූහයකි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) වගේ ජාත්‍යන්තර ආයතන 70 දශකයේදී පමණ සහභාගිත්ව සංවර්ධනය ගැන කතා කරන්න පටන් ගත්ත. හැබැයි ඒ ඔවුන්ගේ සංවර්ධන වැඩ සටහන් වලින් ව්‍යාපෘති ප්‍රවේශය (project approach) ඇත් කිරීමේ බලා පොරොත්තුවකින් නම් කියල හිතන්න බැහැ.

1985 පමණ වන විට IRDP තුල ඉහල සිට පහලට (top-down) සැලසුම් කොට ක්‍රියාත්මක කලන ලද ව්‍යාපෘති වලින් ඒ දිස්ත්‍රික්කවල අපේක්ෂිත සංවර්ධන අරමුණු ඉටු නොවන බව තේරුම් ගත් බලධාරීන් සහභාගිත්ව සංවර්ධන ක්‍රම වේදයන් පදනම් කර ගෙන යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කලද ඒ දිස්ත්‍රික්කවල දිළිඳු කම පිටු දැකීම සඳහා ඒවායිනුත් පිටිවහලක් නොලැබුණු බව අද බොහෝ දෙනෙක් පිළිගන්නා කාරණයකි. එය සහභාගිත්ව සංවර්ධන සංකල්ප වල වරදක් නොවේ. ව්‍යාපෘති බලධාරීන් එය තේරුම් ගෙන තිබුණු අයුරු මෙන්ම එය ක්‍රියාවට නංවන ලද ආකාරයෙහිද තිබූ වරද නිසා සිදු වූවකි.

ඒ IRDP හා සමගාමීව හැත්තෑව දශකයේ අග භාගයේ දී දිළිඳු කම පිටු දැකීම මුඛ්‍ය පරමාර්ථය කර ගත් විපර්යකාරක වැඩසටහනද කාර්යබද්ධ පර්යේෂණයක් ලෙස දියත්විනි. එය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබුණේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයටයි.

ඉහත කී IRDP බලධාරීන් සහභාගිත්ව සංවර්ධන සංකල්ප අහුලා ගත්තේ විපර්යකාරක වැඩසටහනෙනි. නමුත් ඔවුන් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදයන් සොයා පැමිණෙන විට විපර්යකාරක වැඩසටහනේ, විශේෂයෙන් ක්‍රමවේදයේ, විකෘති වීම් දකින්නට ලැබුණි. **එහෙයින් IRDP බලධාරීන් අනුන්ගෙන් අහුලාගත් විකෘති වූ සංකල්ප සමග දිළිඳුකම පිටු දැකීම උගහටය. ලියුම් කරු එසේ පවසන්නේ 1999 දී මොනරාගල IRDP යේ සමාජ සජීවීකරණ සංරචකය ඇගයීමට ලක් කිරීමේදී ලැබූ අත්දැකීම් පදනම් කරගෙනයි.**

අපේ රටේ ක්‍රියාත්මක වී ඇති IRDP මෙන්ම අනිකුත් බොහෝ සංවර්ධන වැඩසටහන් සඳහාද පාදක කර ගෙන ඇත්තේ ව්‍යාපෘති ප්‍රවෙශයන්ය (project approach). ඒවා බොහොමයක් අපේක්ෂිත ප්‍රතිඵල ගෙන දෙන්නට අපොහොසත් වී ඇති බව ප්‍රසිද්ධ කාරණයකි. එහෙයින් මේ ලිපිය මගින් අප බලා පොරොත්තු වන්නේ මෙතෙක් සැකෙවින් සඳහන් කරන ලද නොවිධිමත් අධ්‍යාපන වැඩ පිළිවෙල වැනි වැඩ පිළිවෙලක් මගින් ග්‍රාම සංවර්ධනය සඳහා ක්‍රියාවලී ප්‍රවේශයක් (process approach) හඳුන්වා දීමට ඇති හැකියාව ගැන සාකච්ඡා කිරීමටයි.


## 4.2 නොනවතින (සම්ප්‍රදායික නොවන) නොවිධිමත් අධ්‍යාපනය.

දැන් අපි කතා කරල නවත්තපු නොවිධිමත් අධ්‍යාපනය දෙසට ආයෙත් හැරෙමු. අපි සාකච්ඡා කරන්නේ නොනවතින නොවිධිමත් අධ්‍යාපන (Lifelong Learning) ක්‍රියාවලියක් ගැන. ඒ තුලින් උත්සාහ කරන්න සූදානම් වන්නේ ගැමියන් ලවාම ගැමි යථාර්ථය විමර්ශනය කිරීමටයි. එවැනි ක්‍රියාවලියක් තුල දුප්පත් ප්‍රජාව මෙන්ම මැදිහත් කරු ද දැනුමෙන් පොහොසත් වේ. එමෙන්ම එම දෙපාර්ශ්වය තුලම අලුත් දැනුම එකතු වන්නා සේම (learning) තවදුරටත් වලංගු නොවන පරණ දැනුම බැහැර කෙරේ (unlearning). පහත දැක්වෙන රූපසටහනෙහි එක් රාමුවක මෙම ක්‍රියාවලිය පැහැදිලි කිරීමට උත්සාහ කොට ඇත.

එම ක්‍රියාවලිය තුල සිදු වන දැනුවත් වීමේ මට්ටම් අනුව නොයෙක් නිර්මාණශීලී කටයුතු වලට දුප්පතුන් පෙලඹේ. අපේ අත්දැකීම් අනුව මුලින් ම බිහි වන නිර්මාණය වන්නේ දුප්පතුන්ගේ සංවිධාන ව්‍යුහයක් බිහි වීමයි. ඒ හා සමගම ඔවුන් ගේ මූල්‍යය ශක්තීන් වර්ධනය වන ආකාරයේ කටයුතු ද නිර්මාණය වේ. බොහෝ විට ඒ ඔවුන්ගේ ඉතුරුම් වර්ධනය කිරීම සඳහා වන කටයුතු විය හැක. ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය සහ අලෙවිකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ කටයුතු විය හැක. එම නොනවතින නොවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය මෙසේ දිග හැරෙද්දී දුප්පතුන්ගේ සිතීමේ, ගැටළු විශ්ලේෂණය කිරීමේ, මූල්‍ය, සහ සංවිධාන ශක්තීන් වැනි ශක්තීන් වර්ධනය වේ. එය අප

හඳුන්වන්නේ දුප්පතුන්ගේ ස්වශක්තිය (self-reliance) වර්ධනය වීමක් ලෙසයි. ස්වශක්තිය වර්ධනය වෙන විට ඔවුන් නිරායාසයෙන් ම සවිබලවතනයකට ද (empowerment) ලක් වේ. එම ක්‍රියාවලිය රූප සටහන් 1 හි දැක්වේ.

රූප සටහන 1: නොනවතින නොවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය




## 5.0 සමාප්තිය.

මෙම ලිපියේ ආරම්භක කොටසේ සඳහන් කරන ලද පියරපන්දෝව ගමේ ගොවි කණ්ඩායම් ඉහළින් කෙටියෙන් සඳහන් කරන ලද නොවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේ නිරත වූ සහ එමගින් දැනුවත් වූ සහ දැනුවත් වෙමින් සිටි පිරිසකි. ඔවුන් මෙන් ම අනෙකුත් දුප්පතුන් ද දැනුවත් වෙන ක්‍රියාවලිය සරල සමීකරණයකින් පැහැදිලි කිරීමට උත්සාහ කරමි.

$$R_t = I_t + S_t$$

$R_t$ යනු කිසියම් කරුණක් ගැන යම්කිසි t අවස්ථාවකට අදාළ යථාර්ථයයි. නැත්නම් සත්‍යයි. නමුත් එම සත්‍යය ද කාලයකට පසු වෙනස් විය හැක. ගතිකය ගැන නිව්ටන් ගේ මත අයින්ස්ටයින්ගේ සාපේක්ෂතා වාදය නිසා වෙනස් වුනා සේ.

$I_t$ යනු ඉහත $R_t$ යටතේ අදාළ කර ගත් කරුණ සම්බන්ධයෙන් ම වූ t අවස්ථාවට අදාළ මතුපිටින් පෙනෙන යථාර්ථයයි. කෙනෙකු සතු දැනුම සහ ආකල්ප මත සමාජ ගැටළු පිළිබඳ ව පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ මත තිබිය හැක. එහෙයින් ප්‍රජාව මුලින් ම විමර්ශනයට ලක් කරන්නේ තම ගැටළු පිළිබඳ මතු පිටින් පෙනෙන යථාර්ථයයි ($I_t$). එසේ විමර්ශනය කරනු ලබන්නේ සාමූහිකව වන හෙයින් එම ගැටළු ගැන සම්මුතීන්ට එළඹීමට ඔවුන් ට

හැකියාවක් ඇත. එසේ විමර්ශනය කරද්දී පවතින යථාර්ථය ඔවුන්ට අවාසි දායක යයි පෙනුණ හොත් එය වාසිදායක අන්දමින් වෙනස් කිරීමේ ඉඩකඩ පවතින්නේ ද එම යථාර්ථය තුලම බව ඔවුන් තේරුම් ගනියි. එහෙයින් එම අවාසිදායක යථාර්ථය වෙනස් කිරීමේ ඉඩකඩ සොයා ගැනීමට ඔවුන් පෙලඹේ. එම ඉඩ කඩ ඉහත සමීකරණයේ $S_t$ ලෙස දක්වා ඇත. සමාජ ගැටළු සම්බන්ධයෙන් වන සෑම අවස්ථාවක දීම මෙහි දැක්වෙන $S_t>0$ වේ. එනම් ධන අගයක් ගනී.

එම ඉඩකඩ සොයා ගත් පසු එය ප්‍රයෝජනයට ගනිමින් අවාසිදායක යථාර්ථය වාසිදායක වන අයුරින් වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට දුප්පතුන් පෙලඹේ. එම ක්‍රියාමාර්ග  දුප්පතුන් විසින් ම නිරන්තර ඇගැයීමට ලක් කරන හෙයින් ඔවුන් යලි යළිත් දැනුවත් වේ. එහෙයින් ඉහත විස්තර කරන ලද නොනවතින නොවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය දුප්පතුන් සජීවී කරණයකට ලක් කරන ක්‍රියාවලියක් ලෙස මෙන්ම සංවර්ධන ය සඳහා ක්‍රියාවලී ප්‍රවේශයක (process approach) ආරම්භය ලෙසද  හැඳින්විය හැකිය.

මෙම ලිපියෙන් යමක් උපුටා දක්වන්නේ නම් කතෘගේ නම සඳහන්කොට ඔහුට ගෞරවය ලබාදෙන මෙන් ඉල්ලමි.

# විපර්යකාරක වැඩසටහනේ ආරම්භය හා විකාශය.

ඩබ්.ඩී.එන්.වීරසූරිය
ජ්‍යෙෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි.

සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ජනතාව අතරට පත්කොට ක්‍රියාත්මක කරන ලද විපර්යකාරක වැඩසටහන වූ කලී යථාර්තයෙන් ම දිළිඳුකම දුරලීම සඳහා වූ සහභාගිත්ව සංවර්ධන වැඩසටහනකි. විශේෂයෙන් ම දිළිඳු ප්‍රජාව දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් තුළින් සවිබල ගැන්වීම සඳහා වූ සමාජ සජීවිකරණ උපාය මාර්ගයකි.

එමෙන් ම ගැමි දිළිඳු ජනතාව අතර පණගන්වාලූ සංවර්ධන ක්‍රියාවලිය ජනතාවගේ ම සංවර්ධන ක්‍රියාවලියකට මග පාදාලමින් ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වයෙහි හා ස්වරූපයෙහි සැලකිය යුතු වෙනස්කම් උපදවාලීය. දශක පහකට ආසන්න කාලයක් තුල සංවර්ධන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා විපර්යකාරක වැඩසටහනෙහි සංකල්ප හා ක්‍රමවේදය යොදා ගන්නා ලද්දේ එහි ඇති සුවිශේෂී ලක්ෂණ හේතුවෙනි.

විපර්යකාරක වැඩසටහනෙහි ආරම්භය හා විකාශය පිළිබඳව සලකා බැලීමේ දී ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් 1978 වර්ෂයේ දී ආරම්භ කරන ලද කාර්යබද්ධ ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතියේ (Rural Development Training and Action Research Project) ප්‍රතිඵලයක් වශයෙන් ගොඩනැගුණු ග්‍රාම සංවර්ධන වැඩසටහන විපර්යකාරක වැඩසටහන නමින් හැඳින්විණි.

විපර්යකාරක වැඩසටහන ග්‍රාම සංවර්ධනය සඳහා නව ප්‍රවේශයක් විය. මෙතෙක් පැවැති සංවර්ධන වැඩසටහන් වලින් නොසලකා හැර තිබුණු, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් පීඩාවට පත් වූ දිළිඳු ප්‍රජාව සතු නිර්මාණශීලි කුසලතාවයන් ඉස්මතු කර ගනිමින් ඔවුන් සංවර්ධනයේ කේන්ද්‍රිය පුද්ගලයන් බවට පත්කර ගැනීම ග්‍රාම සංවර්ධන ප්‍රවේශයේ මූලික අරමුණ විය.

"ජනතාව සංවර්ධනයේ නිර්මාණකරුවන්ය, කර්තෘවරුන් ය. එසේ නොමැතිව, සංවර්ධනයට ඉලක්ක වන ගොදුරුවන වස්තූන් රැසක් නම් නොවේ. සංවර්ධනය උඩසිට ජනතාව මත පාත් කළ හැක්කක් නොවේ. සංවර්ධනය ජනතාව තුළින් මතුවිය යුතුයි. විකසිත විය යුතුයි. එබැවින් සංවර්ධනයට පිවිසෙන නව මගෙහි බලකනු දෙකක් ඇත. ඒ ස්වශක්තිය හා ජනතා සහභාගීත්වයයි. මෙය ඉතා කෙටියෙන් විස්තර කල ද විපර්ය කාරක වැඩසටහනේ අරමුණ කුමක්දැයි මේ තුළින් පැහැදිලි වනු ඇත. විපර්යකාරක වැඩසටහන නිල වශයෙන් ආරම්භ වූයේ 1978 අගෝස්තු මස 28 දින වුවද එහි ඉතිහාසය සොයා බැලීමේ දී 1970 දශකයේ මුල් කාලය දක්වා දිව යයි. විර්යකාරක වැඩසටහනේ ආරම්භ සඳහා බලපෑ විශේෂ කරුණු කිහිපයක් පහත පරිදි විස්තර කර දැක්විය හැකිය.

1970 දී ශ්‍රී ලංකා රජය ජර්මනියේ කොන්රාඞ් ඇඩිනෝර් පදනම සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුම විපර්යකාරක වැඩසටහන මෙරට ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස විශ්ලේෂකයින් පෙන්වා දී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මෙරටේ ග්‍රාමසංවර්ධන සමිති හා ඊට සමාන ග්‍රාමීය

සංවිධානයන්හි නිලධාරීන් පුහුණු කිරීම සඳහා අනුග්‍රහය ලැබුණි. දිවයින පුරා විසිරී සිටි ග්‍රාම සංවර්ධන සමිති සහ ප්‍රජාමූල සංවිධානයන්හි නිළධාරීන් සඳහා මේ තුළින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම සමස්ථ පුහුණු වැඩසටහන 1977 දී ඇගයීමකට ලක් කරන ලද අතර එහිදී පෙනී ගියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා එම පුහුණුව ප්‍රමාණවත් නොවූ බවයි. එසේම එහිදි භාවිතා කරන ලද පුහුණු ක්‍රමවේදයන් යල්පැනගිය සම්ප්‍රදායික ස්වභාවයක් ඉසිලීය. 1977 දී ඩී.ඩී.එස්. රත්නවීර මහතා විසින් සකස් කල "Evaluation Report of Past Approaches to Rural Development and Traning" යන වාර්තාවෙන් ද සම්ප්‍රදායික පුහුණු ක්‍රමවේදයේ සහ එවකට පැවති ග්‍රාමසංවර්ධන ප්‍රවේශයේ දූර්වලතා සඳහන් කර තිබුණි. මේ නිසා 1977 වන විට ග්‍රාම සංවර්ධනය පිළිබඳ නව ප්‍රවේශයක දැඩි අවශ්‍යතාවක් මතුවෙමින් පැවතුණි.

එසේම 1974 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ ආසියානු සංවර්ධන ආයතනය (United Nations Asian Development Institute) (UNADI) ග්‍රාම සංවර්ධන ප්‍රවේශයන් සාකච්ඡාවට භාජන කරන ලදී. මෙහි අවසාන නිගමනය වූයේ දකුණු ආසියාවේ පවත්නා ග්‍රාම සංවර්ධන ප්‍රවේශයන් තවදුරටත් වර්ධනය හා පෝෂණය කරමින් භාවිතා කිරීම පිළිබඳ අදහසක් හා ග්‍රාම සංවර්ධනය සඳහා 'අලුතින් නව රාමුවක්' සකස් විය යුතු බවයි. නැතහොත් නව ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාවයයි.

මේ අනුව, 1976 දකුණු ආසියාවෙන් තෝරාගත් විශේෂඥ කණ්ඩායමට ජී.වී.එස්.ද. සිල්වා හා ආචාර්ය පොන්නා විග්නරාජා - ශ්‍රී ලංකාව, ආචාර්ය වහිදුල් හක් හා ආචාර්ය අන්සූර් රහමන් - බංගලාදේශය, ආචාරය නිරංජන් මේතා - ඉන්දියාව යන විද්වතුන් ඇතුලත් විය. මොවුන් ග්‍රාම සංවර්ධනය පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණයක් කරන ලදී. ඔවුන් විසින් ඒකාබද්ධව සිදුකරන ලද අධ්‍යයන කිහිපයක් මගින් ග්‍රාම සංවර්ධනය පිළිබඳව විකල්ප ක්‍රමෝපායන් සැලකිල්ලට ලක් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මේ සම්බන්ධ කරුණු හෙළිදරව් කෙරෙන පොත්පත් කිහිපයක් එළ කෙරිණි. ඉන් මුල් කෘතිය වූයේ "Towards A Theory of Rural Development" (ග්‍රාම සංවර්ධනය පිළිබඳ න්‍යායක් කරා) නැමති කෘතියයි. දෙවැනි කෘතිය වූයේ "Micro Level Development Design and Evaluations of Rural Development" , යන ග්‍රන්ථයයි. මෙයට අමතරව ඉන්දියාවේ මහාරාෂ්ත්‍ර ප්‍රාන්තයේ 'භූමිසේනා' ව්‍යාපාරය පිළිබඳ කෙරුණු විග්‍රහය ග්‍රාම සංවර්ධනය පිළිබඳ නව ප්‍රවේශයකට මඟ හෙළිකරන්නක් විය. 'භූමිසේනා' යනු දුප්පතුන් සිය බලය සඳහා ගෙන ගිය අරගලය විස්තර වන විෂය අධ්‍යයනයකි. (Bhoomi - Sena Case study struggle for peoples power)

ග්‍රාම සංවර්ධනය සඳහා නව ප්‍රවේශයන් සොයා යන ගමනේ දී දකුණු ආසියාවේ සමාජ විද්‍යාඥයින්ගේ අධ්‍යයන මත නිරීක්ෂණයන්ට අමතරව ඩැග් හැමර්ෂල්ඩ් පදනම විසින් 1975 දී තවත් සංවර්ධනයක් (Another Development) පිළිබඳ අදහස් පල කරන ලදී. එමඟින් ග්‍රාම සංවර්ධනය සඳහා නව මානයක අවශ්‍යතාවය නව සංවර්ධන ප්‍රවේශයක් ද, නව ක්‍රමවේදයක් ද අවශ්‍ය බව අවධාරණය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් වලද නව ප්‍රතිසංස්කරණයක් ඇතිවිය යුතු බව පෙන්වා දෙන ලදී. මේ අනුව 1977 වන විට දකුණු ආසියාවට අමතරව බටහිර රටවලින් ද ග්‍රාම සංවර්ධණය පිළිබඳ නව ප්‍රවේශයක් සම්බන්ධ අදහස් පලකර තිබුණි. එසේම 1977-78 වන විට ඉන්දියාවේ සහ බංගලාදේශයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර අත්දැකීම් ලබා තිබූ උගතුන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධනයේ නව දිශානතියක් පිළිබඳ උනන්දු වීම මහත් වාසියක් විය. ඉන්දියාවේ බැංකු කළමනාකරණය පිළිබඳ ජාතික ආයතන (NIBM) මගින් බෙංගාල ප්‍රාන්තයේ ඉතා දුගී ගම්මාන කේන්ද්‍රකරගෙන නව වැඩපිළිවෙලක් ආරම්භ කර තිබුණි. පසුව මෙම වැඩසටහන පීඩිත් (PIDT) නමින් බිහි වූ රාජ්‍ය

නොවන සංවිධානය විසින් බාරගන්නා ලදී. බංගලාදේශයේ කොමිල්ලා ප්‍රදේශයේ ඉඩම් අහිමි දුප්පත් කම්කරුවන් කේන්ද්‍රකරගෙන ආරම්භ කළ වැඩසටහන ප්‍රොසිකා නමින් හැඳින්විණ. මෙය ඉතා සුවිශේෂී අත්දැකීමක් විය කිසිදිනක සංවර්ධන ක්‍රියාවලිය හා එක් නොවූ ඉන් ඈත්ව සිටි පිරිස් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම් විය.

මේ අනුව ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ නව අත්දැකීම් ශ්‍රී ලංකාවේ මෙවැනි ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රභල උත්තේජනයක් විය. ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු බංග්ලාදේශය හා ඉන්දියාවේ නව ග්‍රාම සංවර්ධන වැඩසටහන් පිළිබඳ අත්දැකීම් ලබා තිබුණි. ජී.වී.එස්. ද සිල්වා මහතා සහ ආචාර්ය පොන්න විග්නරාජා මහතා ශ්‍රී ලංකාවට පැමිණියේ මෙම සියලු අත්දැකීම් පිළිබඳ අවබෝධයකින් යුක්තව ය.

මෙම පසුබිම තුල ජර්මනියේ කොන්රාඩ් ඇඩිනෝර් පදනම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ග්‍රාම සංවර්ධන පර්යේෂණ මණ්ඩලය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන සමඟ කරන ලද සාකච්ඡා වන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාම සංවර්ධන පිළිබඳ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. මේවන විට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව අයත්ව තිබූ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මේ සඳහා වන පරිපාලන කටයුතු සියල්ල භාර ගත් අතර මූල්‍ය පහසුකම් හා සම්පත් දායක සේවාව කොන්රඩ් ඇඩිනෝර් පදනම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ලබා දෙන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණ කාර්යය සඳහා ඉතාම සූක්ෂම අයුරින් සුදුසු පර්යේෂණ කණ්ඩායමක් හඳුනාගත් අතර එයින් පහලොස් දෙනෙකු රාජ්‍ය නිලධාරීන් වූහ. ඊට අමතරව මාධ්‍යවේදීන් එක් අයෙකු සහ ස්වේච්ඡා ක්‍රියාකාරීන් එක් අයෙක් ද මෙම පිරිසට අයත් වූහ. මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා තවත් ප්‍රභල සාධකයක් වූයේ රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබුණු සහයෝගයයි. ඒ සඳහා පුරෝගාමී වූයේ ග්‍රාම සංවර්ධන පර්යේෂණ මණ්ඩලයේ සභාපති හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කළ වී.ඩී.බී. උනන්තැන්න මහතා ය. මෙම සියලු කාර්යයන් ඉටුවීමෙන් පසු 1978 අගෝස්තු මස 28 දින බොරැල්ලේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂන ආයතනයේ දී විපර්යකාරක වැඩසටහන ආරම්භ විය.

එක්සත්ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ උපදේශකයන් මූලික පුහුණුකරු කණ්ඩායමේ සම්පත්දායක මණ්ඩලය ලෙස කටයුතු කල අතර පුහුණු කටයුතු පිළිබඳ විමර්ශනය හා ඇගයීම පර්යේෂණ මණ්ඩලය විසින් සිදුකරන ලදී. මෙම පර්යේෂණ මණ්ඩලය රාජ්‍ය පරිපාලන, කර්මාන්ත, සෞඛ්‍ය යන අමාත්‍යාංශවල ලේකම්වරුන් සමඟ තවත් විද්වතුන් කණ්ඩායමකින් සමන්විය විය. මහාචාර්ය නන්දාස කෝදාගොඩ, ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු, වෛද්‍ය තිලක් ගුණසිංහ, ලාල් විජේපාල ආදි විද්වත්හු ඒ අතර විය.

මූලික පර්යේෂණ කණ්ඩායමේ පුහුණු කාලය මාස 15 ක් විය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ පළාත් හතරකින් එකිනෙකට වෙනස් වූ ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත ගම්මාන හතරක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව වැලිගම - මිරිස්ස ගම්මානය, මිනුවන්ගොඩ - මැටිකොටමුල්ල ගම්මානය, අවිස්සාවේල්ල - පින්නවල ගම්මානය සහ උඩුනුවර - මාන්ගමුව ගම්මානය) තෝරා ගන්නා ලදී. මෙම පර්යේෂණ කණ්ඩායම් අදාළ ගම්මානයන් හි උත්ප්‍රේරක මැදිහත්වීමකින් යුතුව පර්යේෂණ කාර්යෙහි නිරත වෙමින් හෙලි කරගත් කරුණු ජනතාව සමඟ සාකච්ඡා කරමින් විග්‍රහ කරගනිමින් සංවර්ධනයේ බාධාවන් බිඳ හෙළීමට ගතයුතු ක්‍රියාමාර්ග ජනතාව තුළින් ම හඳුනා ගැනීමේ කාර්යෙහි නිරත වූහ. මෙම පර්යේෂණාත්මක ක්‍රියාවලිය තුල හඳුනාගත් විපර්යකාරක ක්‍රමවේදයේ විශේෂත්වය

වන්නේ විමර්ශනය, විග්‍රහය හා යථාර්ථය හඳුනාගැනීම යන සියලු කරුණු ක්‍රියාවලියක් බවට පත්කරලීමයි. මේ තුල පුද්ගලයාගේ දැනුවත් වීම හා විඥානය පිබිදවීම සිදුකරනු ලබයි. විපර්යකාරක වැඩසටහන තුල අවධාරණය කෙරෙන මෙම යටපත් වු විභව ශක්තීන් උද්දීපනය 1990 දශකයේ දී සමාජ සජීවිකරණය ලෙස ප්‍රචලිත විය.

## විපර්යකාරක වැඩසටහනේ විකාශය

විපර්යකාරක වැඩසටහන මේ වන විට වසර 44 ක කාලයක් ක්‍රියාත්මක වී ඇත. මෙම කාලය තුල විපර්යකාරක වැඩසටහනෙහි විකාශනය සම්බන්ධයෙන් අධ්‍යයන කිහිපයක් සිදුකර ඇති අතර අවසන් වරට කරන ලද අධ්‍යයනය වන්නේ ආචාර්ය ටියුඩර් සිල්වා ඇතුළු කණ්ඩායම විසින් සිදුකරන ලද අධ්‍යයනයයි. මීට පෙර විපර්යකාරක වැඩසටහන පිළිබඳ මූලික පර්යේෂණ කණ්ඩායමේ පර්යේෂකයෙකු වන මොනිකා රුවන්පතිරණ මහත්මිය විසින් ද මූලික පුහුණුකරුවකු වන විල්ප්‍රඩ් කරුණාරත්න මහතා විසින් ද වැඩසටහන පිළිබඳව අධ්‍යයනයන්හි නිරත වී ඇති බව වාර්තා වී ඇත. පර්යේෂණ කණ්ඩායම් වලට අනුව විපර්යකාරක වැඩසටහනෙහි ආරම්භක අවධිය 1978-1984 ලෙස හඳුනාගෙන ඇත. ආචාර්ය කාලිංග ටියුඩර් සිල්වා මහතා ඇතුල කණ්ඩායම සිදුකරන ලද පර්යේෂණයේ දී මෙම අවධිය නිර්මාණාත්මක අවධිය ලෙස හඳුනාගෙන ඇත. 1978-1984 ග්‍රාම සංවර්ධන දුගී බව පිටු දැකීමෙහිලා සුවිශේෂවූත්, දේශීයවූත් ප්‍රවේශයක් ලෙස විපර්යකාරක ප්‍රවේශය සංකල්පගත වුයේ මේ අවධියේ ය. ග්‍රාමීය සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීම අරඹයා වැදගත්වන සාධනීය ලක්ෂණ ගණනාවක් හඳුනාගනු ලැබුව ද වැඩසටහනේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඇතැම් බාධාවන් කිහිපයක් සිදුවිය. මූලික පුහුණුකරුවන්ට අමතරව වරින් වර කිහිපවතාවක් පුහුණුකරුවන් බඳවා ගැනීම හා පුහුණු කිරීම සිදුකල ද එම පිරිස් වරින් වර ඉවත්ව යාම සතුටුදායක තත්ත්වයක නොවීය. පුහුණුකරන ලද නිලධාරින් සංඛ්‍යාව 157 දෙනෙකු වුවද ඉතිරි වූ සංඛ්‍යාව 86 දෙනෙකු බව සඳහන් වේ. කේන්ද්‍රිය ගම අවට තවත් ගම්මාන 05 ක් ඉලක්ක කර ගනිමින් ගම් වලල්ලක් ලෙස මෙම කාලය තුළ වැඩසටහන ව්‍යාප්ත විය.

විපර්යකාරක වැඩසටහනෙහි විකාශය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට 1985-1989 කාල පරිච්ඡේදය ඉතා වැදගත් වේ. මෙම වකවානුව වන විට වැඩසටහනේ නිර්මාතෘවරුන් සහ මූලික පුහුණු කරුවන් කිහිපදෙනෙකු එක් වී පීඩා ආයතනය පිහිටුවා ගනු ලැබීය. පීඩා ආයතනය බිහිවුයේ 1980 වුවද තෝරාගත් කාර්ය ස්ථානය කිහිපයක් තුල එහි කටයුතු වඩාත් පුළුල් ව විකාශය වන්නට පටන් ගත්තේ මෙම කාලයේ දී ය. ‘පීඩා’ ආයතනය පිහිටු වුයේ විපර්යකාරක ක්‍රමවේදය වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙනයාම සඳහා ය. ‘පීඩා’ ආයතනයේ වැඩසටහනින් සිදුවුයේ සමාජ සජීවිකරණ ක්‍රමවේදය වඩාත් පුළුල් වීම සහ අර්ථවත් වීමයි. පීඩා ආයතනයට අමතරව මූලික පුහුණුකරුවකු විසින් 1985 දී තෝලංගමුව මානව සම්පත් මධ්‍යස්ථානය ගොඩනගා ගන්නා ලදී. එසේම වරින් වර බඳවාගෙන පුහුණු කරන ලද පුහුණුකරුවන් ලෙස සේවය කළ ග්‍රාම සංවර්ධන නිළධාරීන් 57 දෙනෙකු අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉවත් කර ගැනීම ක්ෂේත්‍රයේ කටයුතු දුර්වල කරන්නක් විය. 1989 වන විට ඇති වූ සමාජ නොසන්සුන්තාවය ද වැඩසටහනෙහි ව්‍යාප්තිය කෙරෙහි බලපවත්නා ලද කරුණක් විය. එසේ වුවද 1984 වන විට දිවයිනේ දිස්ත්‍රික් 13 ක කාර්ය ස්ථාන 73 ක වැඩසටහන ව්‍යාප්තව පැවති බව වාර්තා වෙයි. එසේම ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සඳහා විපර්යකාරක වැඩසටහන අනුදත් සමාජ සමාජ සජීවිකරණ ක්‍රමවේදය බද්ධ කර ගැනීම ආරම්භ වුයේ ද මෙම කාලපරිච්ඡේදය තුළදි ය. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මෙහෙයවන වැඩසටහන් වලට අමතරව, රජයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වලදී සමාජ සජීවිකරණය අනිවාර්ය අංගයක් බවට පත්වුයේ එය ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්වුවායින් පසුවය.

විපර්යකාරක වැඩසටහන පිළිබඳ අධ්‍යයන කළ විද්වත්හු 1990-1995 කාල පරාසය වැඩසටහනෙහි සංවර්ධන අවදිය ලෙස හඳුනා ගන්නා ලදී. 1980 දශකයේ අගභාගය වන විට වැඩසටහන කෙරෙහි බලපෑම් කළ අහිතකර හා හිතකර සාධක කෙරෙහි අවධානය යොමුකළ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය කළමනාකාරිත්වය අහිතකර සාධක පාලනය කර ගැනීමටත් හිතකර සාධක වැඩසටහනේ උන්නතිය සඳහා යොදා ගැනීමටත් උත්සුක වූ බව පෙනේ. එසේ ම රජයේ සංවර්ධන ක්‍රියාදාමයට දායක වන අයුරින් ආයතනයේ සංවිධාන ව්‍යුහය හා කාර්යයන් ගලපා ගන්නා ලදී.

1991 වර්ෂයේ ජනවාරි මසවන විට විපර්යකාරක වැඩසටහන දිස්ත්‍රික්ක 11 ක උපදිසාපති කොට්ඨාස 62 ක ක්‍රියාත්මකව පැවතුණි. ඒ සඳහා සීඩා ජාත්‍යන්තර ආයතනය හා කෙයාර් ආයතනය යන විදේශිය ආයතන මඟින් මූල්‍යාධාර සපයන ලදී. ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, මහනුවර, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක සඳහා සීඩා ආයතන ද අනුරාධපුරය හා පුත්තල ම දිස්ත්‍රික්ක සඳහා කෙයාර් ආයතනය ද මූල්‍ය සහාය ලබාදෙන ලදී. 1990 දශකය ආරම්භයේ දී ම මෙතෙක් වැඩසටහන පවත්වාගෙන ආ ස්වරූපය වෙනසකට භාජනය කරමින් ගමක් කේන්ද්‍ර කරගෙන මෙහෙයවන පොකුරු ගම්මාන/ ගම්වළලු ක්‍රමය වෙනුවට කඩිනම් ව්‍යාප්තිය අරමුණුකර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් පදනම් කරගත් මෙහෙයුම් ආදර්ශයක් ක්‍රියාවට නගනු ලැබුවේ මෙම අරමුණු මුදුන්පත් කරගනු පිණිස ය. මේ යටතේ ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගත් විපර්යකාරකයින්/ ස්වේච්ඡා සේවකයින් සඳහා අධියර ගත පුහුණුව ලබා දී එකවර අදාළ ගම්මානයන්හි වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. මෙම ක්‍රමය දිස්ත්‍රික්ක හයක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 ක ක්‍රියාත්මක කරන ලදී. වැඩසටහනේ කඩිනම් ව්‍යාප්තිය සඳහා ආයතනය මැදිහත්වීමට තවත් හේතුවක් වුයේ රජයේ ජාතික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කළ ජනසවිය වැඩසටහන තුල සමාජ සජීවිකරණ ක්‍රමවේදය ප්‍රධාන උපායමාර්ගයක් ලෙස යොදා ගැනීමයි. 1991 දී ආරම්භ කළ ජනසවිය භාරකාර අරමුදලේ මූලික ක්‍රමවේදය වුයේ විපර්යකාරක වැඩසටහන භාවිතා කල සමාජ සජීවිකරණ වැඩසටහනයි. විපර්යකාරක වැඩසටහන පර්යේෂණ මට්ටම ඉක්මවා ගිය පුළුල් ව්‍යාප්තිය සඳහා යොමුකළ කාලපරිච්ඡේදයක් ලෙස මෙම අවධිය හැඳින්විය හැකි වේ.

ස්වේච්ඡා සේවක ආකෘතිය යටතේ පුහුණු ලැබූ සේවක සංඛ්‍යාව 500 දක්වා ඉහල නැගිණි. මෙම කාලපරිච්ඡේදය තුල භාවිත කළ සජීවිකරණ සංකල්පයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවූව ද සජීවිකරණ සඳහා භාවිතයේ යෙදවිය යුතු මැදිහත් වීම් ක්‍රියාවලියේ යම් හැකිලීමක් සිදුවිය. සෑම සජීවීකරුවෙක් ම ඉලක්ක සාධනය කලයුතු විය, ගොඩනැගිය යුතු කණ්ඩායම් ගණන ගොඩනැගිය යුතු අරමුදල ආදි විවිධ ව්‍යාප්ති දර්ශක ඔස්සේ එකිනෙකට අයත් ගම්මාන තුල සාධනය කලයුතු ඉලක්ක පැනවිණ. මෙය වැඩසටහනේ පුළුල් ව්‍යාප්තියකට හේතු වූ නමුත්, සමාජ සජීවිකරණයේ ගුණාත්මක භාවය පිරිහීමකට තුඩුදුන් බව පසුකාලීන ඇගයුම්කරුවන් විසින් වාර්තා කර ඇත. එසේ වුවත් 1995 දක්වා ඇති වූ මෙම ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන ගමන්මග සරු කිරීම සඳහා ලබාදුන් ඉහළ දායකත්වයක් ලෙස අගය කළ යුතුව ඇත.

1992 වර්ෂයේ සිට විපර්යාකාරක වැඩසටහන යටතේ ගොඩනැගුනු කුඩා කණ්ඩායම් (ප්‍රාථමික සංවිධාන) එකට එක් වී ගම් මට්ටමේ දී ද්විතියික සංවිධාන ලෙසත්, නැතහොත් ග්‍රාමීය මට්ටමේ සංවිධානය ලෙසත් සංවිධානය විය. කුඩා නිෂ්පාදන කණ්ඩායමේ සංවර්ධන ක්‍රියාවලිය දිගුකාලීනව පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් ඉවහල් වූ බවට නිදසුන් විපර්යකාරක වැඩසටහන තුල සුලභ වේ. එසේම මෙම ද්විතියික සංවිධාන ප්‍රාදේශීය මට්ටමේ දී

තෘතියික සංවිධාන ලෙසට ගොඩනැගෙමින් පැවතුනි. සම්ප්‍රදායික ගැමි නායකයත්ව ඉක්මවා අඩු ආදායම්ලාභී ජනකොටස් තුල ධනාත්මක ආකල්ප ගොඩනැංවීමට මෙම සංවිධාන රටාව ඉවහල් විය.

1995 සිට 2001 කාල පරාසය විපර්යකාරක වැඩසටහන තුල ගොඩනැගුණු සංවිධාන තලය පුළුල් වීම තව තවත් ව්‍යාප්තවන අයුරු දැකගත හැකි විය. 1998 වර්ෂය වන විට සීඩා ආයතනය විසින් ලබාදෙන මූල්‍යාධාර අවසන් වීමට නියමිතව තිබුණි. මෙම අභියෝගයට මුහුණදීමට හැකිවන සේ විපර්යකාරක සාමාජිකයින්ගෙන් සමන්විත ස්වාධීන සංවිධාන ගොඩනැගීමේ අවශ්‍යතාව 1990 තරම් ඈතක සිටම පෙන්වා දී තිබුණි. ඒ අනුව විපර්යකාරක වැඩසටහනේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ මූලික වගකීම ක්‍රමයෙන් ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ප්‍රජාශක්ති සංවිධානය වලටත් එම සංවිධානවල එකතුවෙන් සෑදි ජාතික මට්ටමේ ප්‍රජා ශක්ත මහා සංගමයටත් පවරා දෙනු ලැබිය.

වැඩසටහනේ පුහුණුකරුවන් මෙන්ම සමායෝජකවරුන් ද වැඩසටහනේ පැවැත්ම තහවුරු කරලීම අරමුණු කර ගනිමින් මධ්‍ය සංවිධාන / ප්‍රාදේශීය සංවිධාන ගොඩ නගන්නට උත්නදු වූ බව පෙනේ. මෙම තෘතියික සංවිධාන වැඩසටහන ක්‍රියාත්මක වූ කාර්යස්ථාන වල බලප්‍රදේශයට අනුකූලව ගොඩනැගුණි. ඇතැම් ප්‍රාදේශීය සංවිධාන යම් යම් ප්‍රාදේශීය කොට්ඨාශයන් ආවරණය කරන අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංවිධාන 02 ක් හෝ 03 ක් මගින් ආවරණය කරනු ලබයි. බොහෝ සංවිධාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් දහයක්, පහළොවක් හෝ විස්සක් පමණ ආවරණය කරනු ලබයි. බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජා ශක්ති සංවිධාන ප්‍රජා ශක්ති කලාපීය සංවිධාන ලෙස හැඳින්වේ. මෙම සංවිධානයන්හි අඩු ආදායම්ලාභී සාමාජික පිරිස් තම නිෂ්පාදන, අලෙවි, පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සාමාජික ප්‍රජාවගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලන ක්‍ෂුද්‍ර මූල්‍ය ආයතන පද්ධතියක් ලෙස ක්‍රියාකරනු ලබයි. ඒ අනුව 1996 වසරට පසු විපර්යකාරක වැඩසටහන මෙතෙක් පැමිණි ගමන් මඟ වෙනස් ස්වරූපයක් ගැනීම ආරම්භ වූයේ සියලු ප්‍රාදේශීය සංවිධාන සූක්‍ෂම මූල්‍ය ආයතන පද්ධතියක් බවට පත්වීම හේතුවෙනි. 1998 වන විට ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන 57 ක් ගොඩනැගී තිබුණි. එම සංවිධාන තුල ග්‍රාමීය මට්ටමේ සංවිධාන 697 ක් කුඩා කණ්ඩායම් 6918 ඇතුලත් ව ඇත.

## ප්‍රජාශක්ති මහා සංගමය ගොඩනැගීම.

විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුණු ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජාමූල සංවිධාන ඒකාබද්ධ කෙරෙන මුදුන් මට්ටමේ සංවිධානය ප්‍රජා ශක්ති මහා සංගමය වේ. 1997 අගෝස්තු මස ආරම්භ කළ මෙම සංවිධානයේ මූලික අරමුණ වූයේ ප්‍රජාශක්ති සංවිධාන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ ආයතනික හා මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමයි. සම්පත්, දැනුම හා අත්දැකීම් හුවමාරුව, විපර්යකාරක ක්‍රමවේදය ප්‍රචලිත කිරීම, සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය යොදා ගැනීමට පෙළඹවීම ප්‍රජාශක්ති මහා සංගමයේ සෙසු අරමුණු විය.

සීඩා ජාත්‍යන්තර ආයතනයේ මූල්‍ය අනුග්‍රහය අවසාන වීමත් සමඟ ප්‍රජාශක්ති මහා සංගමය ආරම්භ කරන ලද්දේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මඟපෙන්වීමෙන් හා සීඩා ආයතනයේ ආශිර්වාදයෙනි. විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුණු ප්‍රජාශක්ති ප්‍රජාමූල සංවිධාන සියල්ල 1980 අංක 31 දරණ ස්වේච්ඡා

සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණ කිරීමේ) පනත යටතේ සමාජ සේවා සංවිධානයක් ලෙස හෝ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලබා ඇත.

කාර්යබද්ධ පර්යේෂණ ක්‍රමවේදයක් ඔස්සේ ගොඩනැගුණු විපර්යකාරක වැඩසටහන මේවන විට විධිමත් ආයතන පද්ධතියක් ලෙස විද්‍යාමාන වේ. ආධාරක ආයතන මඟින් ලබාදෙන මූල්‍යාධාර අවසාන වීමෙන් පසු එම සංවිධාන ගමන් මඟකට අවතීර්ණ වී ඇත. මේ සියලු සංවිධාන සම්පූර්ණ ප්‍රශස්ත තත්ත්වයකට පත්ව නැත. ඇතැම් සංවිධාන ඉතාමත් ශක්තිමත් සංවිධාන වන අතර ඇතැම් සංවිධාන දුර්වල මට්ටමක පවතී. සංවිධාන කිහිපයක් විපර්යකාරක පර්යේෂණාගාර ලෙස හැඳින්වීමට තරම් වටිනා සංවිධාන ලෙස ක්‍රියාත්මකව පැවතීම ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට මෙන්ම වැඩසටහනට ද ගෞරවයෙකි. එක හා සමාන තත්ත්වයක නොවුවත් මේ සියලු සංවිධාන විපර්යකාරක වැඩසටහනෙහි ව්‍යාප්තිය සම්බන්ධයෙන් කර ඇති කාර්යභාරය සුවිශාල වේ.

විපර්යකාරක ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් සංවර්ධන ක්ෂේත්‍රය තුල කරන ලද කාර්යයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ලද වැඩසටහනකි. ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩසටහන, ජන සවිය වැඩසටහන, ජාතික සංවර්ධන භාරකාර අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉසුරු වැනි වැඩසටහන් හා සමෘද්ධි වැඩසටහන කෙරෙහි විපර්යකාරක වැඩසටහනේ බලපෑම දක්නට ලැබුණි. රාජ්‍ය නොවන සංවිධාන විශාල සංඛ්‍යාවක් විපර්යකාරක ක්‍රමවේදය ඔස්සේ සංවර්ධන ක්‍රියාකාරීන් දහස් ගණනක් පුහුණුව ලබා ඇත. මෙම සියලු වැඩසටහන් වල ක්‍රියාකාරීත්වය තුලින් විපර්යකාරක ක්‍රමවේදය හෙවත් සහභාගිත්වය සංවර්ධන ක්‍රමවේදය පිළිගැනීමට ලක් වී ඇත. තත්ත්වය එසේ වුවත් වර්තමානයේ විපර්යකාරක වැඩසටහන නැතහොත් එයින් හඳුන්වාදුන් සහාභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය අභියෝග ගණනාවකට වර්තමානයේ මුහුණ දී සිටී.

# විපර්යකාරක වැඩසටහනේ පුරෝගාමීන්.

ජී.ජී.එස් බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි.

1970 දශකයෙන් පසු දකුණු ආසියාවේ සංවර්ධනය පිළිබඳව කථා කිරීමේදී සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හා එහි භාවිතය පිළිබඳව සොයා බැලීමේදී විපර්යකාරක වැඩසටහනට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. ශ්‍රී ලංකාවේ මෙන්ම දකුණු ආසියාවේ විසූ සුවිශේෂී විද්වතුන් කිහිප දෙනෙකුම මෙම විපර්යකාරක වැඩසටහන (Change agent programme) හා බද්ධ වී පර්යේෂණ කටයුතු සිදුකරන ලදි. එලෙසම මෙම වැඩ සටහන හා සමගාමීව දකුණු ආසියාවේ රටවල් (ඉන්දියාව, බංග්ලාදේශය, තායිලන්තය,) කිහිපයකම විවිධ පර්යේෂණාත්මක වැඩසටහන් දියත් කෙරිණි. එලෙස අත්දැකීම් ලත්, හා විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පෘතුල දැනුමකින් හෙබි විද්වතුන් පිරිසක් මෙම විපර්යකාරක වැඩසටහන සඳහා ද තම දායකත්වය සපයන ලදි. ඒ අතර ඉන්දිය ජාතික ආචාර්යය නිරන්ජන් මේතා (Dr.niranjan metha) , බංගලාදේශ ජාතික මහාචාර්යය අනිසූර් රහමාන් (Prof. Anisur Rahman) , පාකිස්තාන් ජාතික ආචාර්යය වහුඩුල් හක් (Dr.Wahudul Hak) ,සහ ශ්‍රී ලාංකික විද්වතුන් දෙදෙනකු වූ අචාර්යය පොන්නා විග්න රාජා (Dr.PonnaVignaraja) සහ ජී. වී.එස්ද, සිල්වා (G.V.S. De. Silva) මැතිතුමා ආදීන් මෙහිදී ප්‍රධාන විය.

1940-1970 කාලය තුල ශ්‍රී ලංකාව තුල දුප්පත්කම අවම කිරීම සඳහා ක්‍රියාත්මක වූ මැදිහත්වීම අසාර්ථක වූයේ ඇයි ? යන්න සොයා බැලීම අරමුණු කරගෙන විපර්යය කාරක වැඩසටහන හෙවත් කාර්යය බද්ධ සමාජ පර්යේෂණ ක්‍රියාවලිය දියත් කිරීමේදී ශ්‍රී ලාංකේය විද්වතෙක් වූ ජී.වී.එස්.ද. සිල්වා මහතා අනුපමේය මෙහෙවරක් ඉටුකළ සමාජ විද්‍යාඥයෙක් ලෙස හඳුනාගත හැකිය. 1928 වර්ෂයේදී උපත ලද ජී.වී. එස් ද. සිල්වා මැතිතුමා තම ද්විතීක අධ්‍යාපනය කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ලැබීමෙන් පසුව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය



හැදෑරීය. 1948 වර්ෂයේදී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් මූලික උපාධිය ලබාගත් ගිණිගේ වර්මන් ස්ටැන්ලි ද සිල්වා නොහොත් ජී.වී.එස්. ද සිල්වා මහතා කෙටිකලක් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්යය වරයෙක් වශයෙන් ද සේවය කළ අතර, ඉන් ඉක්බිතිව 1950-1951 කාලය London School Of Economics ආයතනයේ අධ්‍යාපනය හැදෑරීය. 1954 වර්ෂයේදී විශ්ව විද්‍යාලයෙන් සමුගත් ජී.වී.එස් ද. සිල්වා මැතිතුමා අවුරුදු 15 ක පමණ කාලයක් රාජ්‍ය අංශයේ විවිධ ක්ෂේත්‍රයන් හි සේවය කොට ඇත. විශේෂයෙන්ම 1957 වර්ෂයේදී එවකට විශේෂ කථා බහට ලක්වූ කුඹුරු පනත සැකසීම සඳහා ජී.වී.එස්.ද සිල්වා මහතා විශාල කාර්යය

භාරයක් සිදුකළ අතර, 1957 වර්ෂයේ රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීම සඳහා සුවිශේෂි දායකත්වයක් සපයන ලදි. මෙලෙස රාජ්‍ය අංශයේ කටයුතු සඳහා විශාල දායකත්වයක් සැපයූ ඔහු ශ්‍රී ලංකාව තුල තෙල් බෙදා හැරීමට මෙන්ම රක්ෂණය ජනසතු කිරීමේ කටයුතු සඳහා සැලසුම් සැකසීමේ කාර්යයට විශාල දායකත්වයක් දක්වා ඇත. රාජ්‍ය අංශයේ ව්‍යවසාය කලමනාකරණයට දායකත්වයක් දක්වමින් 1970 වර්ෂයේදී ජී.වී.එස්.ද සිල්වා මහතා UNIDO.ESCAP.theAsion Institute for Development වැනි ආතනවල කාර්යයන් සඳහා දායකත්වය දක්වා ඇත. නිර්මාණශීලි චින්තකයෙකු ලෙස හඳුනාගත හැකි ජී.වී.එස්. ද සිල්වා මහතා ශ්‍රී ලංකාව තුල සිටි නිර්මාණශීලි මාක්ස්වාදී චින්තකයෙකු ලෙස හඳුනාගත හැකිය. සමාජ විපර්යාසය පිළිබඳ රචනය මගින් ඔහු සඳහන් කරන කාරණා ඔහුගේ සමාජීය දැනුම පිළිබඳ කරුණු විදහා දක්වයි. ඔහු සතු අති මහත් දැනුමෙන් හා තීක්ෂණ බුද්ධියෙන් ඕනෑම සාකච්ඡාවක් පොහොසත් කිරීමේ හැකියාව මෙම විද්වතාට හිමිව තිබුනි. ජී.වී. එස්.ද.සිල්වා මහතා බොහෝ දෙනකුගේ මිතුරෙකු, මෙන්ම සමාජ ක්‍රියාකාරකයෙකු , දේශපාලන ක්‍රියා කාරකයෙකු, මෙන්ම ගුරුවරයෙකු ලෙස ප්‍රචලිතය. එවකට සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස මේ මහතා සංගමයට මහත් උත්තේජයක් සපයන ලදි.

කීර්තිමත් අර්ථශාස්ත්‍රඥෙයකු වූ ජී.වී.එස්,ද සිල්වා මහතා , සමස්ථ සමාජ ක්‍රියාවලියම වෙනස් කිරීමට රුචිකත්වයක් දැක්වීය. මේ පිළිබඳව න්‍යායික මෙන්ම ප්‍රායෝගික දැනුම සම්භාරයක් ඔහු සතු විය. එලෙසම දේශපාලන ක්‍රියා කාරකයෙකු ද වූ ජී .වී. එස්. ද සිල්වා මහතා එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුවේ එවකට කෘෂිකර්මය හා ආහාර පිළිබඳ අමාත්‍යවරයා වූ පිලිප් ගුණවර්ධන මහතාගේ පෞද්ගලික ලේකම්වරයා ලෙස ද කටයුතු කර ඇත.

මෙම සමාජ පර්යේෂණය සිදුකිරීමේ දී ග්‍රන්ත රචකයෙක් වූ ආචාර්යය පොන්න විග්නරාජා මහතාද, සුවිශේෂි මෙහෙවරක් කළ ශ්‍රී ලාංකේය විද්වතෙක් ලෙස හඳුනා ගතහැකිය. ග්‍රන්ත රචකයෙක් ලෙස ග්‍රන්ත 08 කට වැඩි ප්‍රමාණයක් මේ මහතා විසින් රචනාකොට ඇති අතර, ඔහු දකුණු ආසියාවේ මෙන්ම ජත්‍යන්තර වශයෙන් දිළිඳුකම ඉලක්ක කරගත් සංවර්ධන බැංකුවේ පුරෝගාමියෙක් ද විය. ජාත්‍යන්තර සංවිධාන ගණනාවක සාමාජිකත්වය හෙබවූ ආචාර්යය පොන්න විග්නරාජා මහතා 1992 වර්ෂයේ දී නිදහස් දකුනු ආසියා දිළිඳුකම තුරන් කිරීමේ කොමිෂමේ සභාපති වරයා ලෙස ද කටයුතු කළේය. තවද



මේ මහතා UNRISD, IFAD, UNICEF, UNESCO, IMF, WORLD BANK, වැනි ආයතන වල උපදේශක මට්ටමේ තනතුරු හෙබවීය. තවද මේ මහතා කොළඹ දකුණු ආසියා සාපේක්ෂ වැදගත්කම පිළිබද (SOUTH ASION PERSPECTIVE NET WORK ASSOCIATION ) ජාල සංගමයේ ( SAPNA ) සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත.

මෙලෙස විපර්යකාරක වැඩසටහන හා සම්බන්ධ පුරෝගාමීන් පිළිබඳ කථා කිරීමේදී මෙම කාර්යබද්ධ පර්යේෂණ වැඩසටහන මෙහෙය වීමේදී සුවිශාල කාර්යය භාරයක් ඉටුකළ පුද්ගලයින් අතර කොළඹ පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වී.

සී. බී. උනන්තැන්න මැතිතුමා ලබාදුන් නායකත්වය පැසසුම් සහගතය. එලෙසම එවකට බටහිර ජර්මන් කොන්රාඩ් පදනමේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත ජේ. ස්ටෝල් මැතිතුමාගෙන් ලැබුන සහයෝගය වැඩ සටහනේ සාර්ථකත්වයට ඉමහත් පිටිවහලක් විය. . එලෙසම පරිපාලන අභ්‍යාස ආයතනයේ උපදේශක සී. අබේගුණවර්ධන මහතා මෙන්ම ජෝර්ජ් මෙන්ඩිස් මහතා, ඇතුළු එවකට සුවිශේෂී විද්වතෙක් ලෙස සැලකූ වෛද්‍ය නන්දදාස කෝදාගොඩ යන මහතුන්ගෙන් ලැබූ සහයෝගය හා විපර්යකාරක වැඩසටහනේ සාර්ථකත්වයට මුසුකළ දැනුම විපර්යකාරක වැඩසටහන සාර්ථක කර ගැනීමට ඉවහල් වූ බව මෙහිලා සඳහන් කළ යුතුය.

තවද, සහභාගත්ව සංවර්ධනය හා විපර්ය කාරක වැඩසටහන පිළිබඳව කරුණු සොයා බැලීමේදී ශ්‍රී ලංකා පරිපාලන ක්ෂේත්‍රයේ දශක දෙකකට වැඩි අත්දැකීම් සම්භාරයක් තිබූ සුසිල් සිරිවර්ධන මහතාද විශාල මෙහෙවරක් ඉටුකල විද්වතෙක් වශයෙන් හඳුනා ගත හැකිය. දිළිඳුකම තුරන් කිරීම අරමුණු කර ගනිමින් 1980 දශකයේ ක්‍රියාත්මක වූ ජනවිය වැඩසටහනේ පුරෝගාමියෙක් ලෙසද, එවකට ක්‍රියාත්මක වූ නිවාස දශලකය වැඩසටහනේ ක්‍රියා කාරිකයෙකු ලෙසද සුසිල් සිරිවර්ධන මහතා සුවිසාල මෙහෙවරක් ඉටුකරන ලදි. එලෙසම 1992 වර්ෂයේදී දකුණු ආසියා දිළිඳුකම තුරන් කිරීමේ කොමිසමේ (SAARC) උපදේශකයෙකු ලෙසද කටයුතු කොට ඇත. සුසිල් සිරිවර්ධන මහතා ග්‍රන්ත රචකයෙකු ලෙස ද එවකට රජයේ ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙසද සුවිසාල කාර්යය භාරයක් ඉටුකළ අතර,



විපර්යකාරක වැඩසටහනේ අත්දැකීම් පදනම් කොටගෙන ජනසවිය වැඩසටහන සඳහා එය ගලපාලීම සඳහා උත්සහායක නිරතවූ විද්වතෙකි. මෙලෙස දෙස් විදෙස් විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙන්, දැනුමෙන් පෝෂිතව ආරම්භ වූ විපර්යකාරක වැඩසටහන මෙරට දිළිඳුකම අවම කිරීම සඳහා ක්‍රියාත්මක ක්‍රියාවලිය තුල දුප්පත් ප්‍රජාවගේ කාලීන ගැටලු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් සෙවීම සඳහා ඔවුන් යොමුකරන කාර්යය බද්ධ පර්යේෂණ වැඩසටහන ආරම්භයේ සිට ක්‍රියාත්මක වූ ආකාරය මෙම කළාපයේම “ විපර්යකාරක වැඩ සටහනේ ආරම්භය හා විකාශය ” පිළිබඳ ලිපියෙන් ඉදිරිපත් වේ.

# විපර්යකාරක වැඩසටහනේ කාලීන වැදගත්කම.

ඩබ්ලිව්. එච්. සිරිසේන
**ජ්‍යෙෂ්ඨ** පුහුණු හා පර්යේෂණ නිලධාරි




වර්තමාන සමාජය මෙන්ම සමස්ත ලෝකය ම, වාණිජකරණයට හසුවී ඇත. භාණ්ඩ ලබාගැනීම හා ඒ සඳහා වන මුදල් ගනුදෙනුව මත සමස්ත සමාජයම භ්‍රමණය වෙමින් පවතී. හොඳින් හෝ නරකින් බලය ලබාගෙන ඒ මත මුදල් හැකියාව තහවුරු කරගන්නා අන්දම නිරන්තරව දක්නට ඇත. එයට පුද්ගල භේදයක් නැත. මෙය සෑම අංශයකම දක්නට ඇත. මේ නිසා ම, අද ලොව බොහෝ තැන්වල ගැටුම් උද්ගතව ඇත. මෙය පවුල් අතරේද, ගම් ගම් අතරේද ගැටුම්කාරී තත්වයන් පවතී. මෙලෙස උද්ගතවන ගැටුම් වර්ධනය වුවහොත් මුළු මහත් ලෝක සමාජයම විනාශය කරා යනු ඇත. මෙයට විසඳුම් පුද්ගලයා විසින්ම සෙවිය යුතුය. විශේෂයෙන්ම මේ වන විට අප රට මුහුණ දී සිටින විදේශ විනිමය අර්බුධයත් සමග මිනිසාගේ සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම දැඩි අර්බුදයකට ලක්ව ඇත. මෙයින් දැඩි ලෙස පීඩාවට පත්ව සිටින්නේ අඩු ආදායම්ලාභී පවුල් වන අතර, විවිධ සමාජ ක්‍රියාකාරකම් ඉස්මතු කිරීමට ද මෙම තත්වය බලපා ඇත. මෙවන් තත්වයක් තුළ ප්‍රජාවගේ සංවර්ධනය පිළිබඳව කටයුතු සංවිධානය හා ක්‍රියාත්මක කිරීමේ දී මෙයට දශක හතරකට පෙර ක්‍රියාත්මක වූ විපර්යකාරක වැඩසටහන තුළින් පිළිබිඹු වූ සුවිශේෂීතාවන් නැවත විමර්ශනයට භාජනය කිරීම සමාජයේ ඉදිරි ප්‍රගමණයට ඉහවල් කරගත හැකි ආකාරය සනාත කරන ප්‍රභල තත්වයකි.

විපර්යකාරක වැඩසටහන තුල අසල්වැසි සියලු දෙනාගේ දියුණුව අපේක්ෂා කරයි. සියලු දෙනාගේම අවශ්‍යතා පිළිබඳව උනන්දුවෙන් කටයුතු කරන අතර, සමාජයේ සමබරතාව සුරැකීමට ද උනන්දුවේ. යම් කොටසකට අසාධාරණ තත්වයක් වේ නම් එයට එරෙහිව කටයුතු කරයි. ඒ සඳහා ප්‍රජාවගේ දැනුවත් බව පුබුදුවාලීමට කටයුතු කරයි. දශක හතරකට පෙර ග්‍රාමසංවර්ධන වැඩසටහනකින් ආරම්භ වී පුළුල් ප්‍රජා

සංවර්ධන ක්‍රියාදාමයක් ඔස්සේ සමස්ත සංවර්ධන ක්ෂේත්‍රයටම බොහෝ වැදගත් උපාංග, මෙවලම් එකතු කිරීමට විපර්යකාරක වැඩසටහන මේ වන විට සමත්ව ඇත. එම මෙවලම් හා ක්‍රමවේදය ගලපාගනිමින් ක්‍රියාත්මක වූ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටම, දිස්ත්‍රික් මට්ටම මෙන්ම ජාතික මට්ටමින් ද ක්‍රියාත්මක කරමින් එහි ප්‍රතිලාභ ඉලක්ක ප්‍රජාව වෙත විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත ළඟාකරදීමට මේ වන විට බොහෝ සෙයින් සමත්ව ඇත. විපර්යකාරක වැඩසටහන තුළ හඳුන්වාදෙන විපර්යකාරකයා එසේත් නැතිනම් මැදිහත්කරුවා මෙම සංවර්ධන ක්‍රියාදාමය තුල වැදගත් චරිතක් වන අතර සංවර්ධන ක්‍රියාවලිය පනගැන්වීමේ මෙහෙයුම් බලවේගය වේ. ජනතාවට සංවර්ධනය ළඟාකර දෙන්නට විවිධ ආකාරයෙන් කටයුතු කරන විවිධ ආයතන හා විෂයන් හරහා අඩු ආදායම්ලාභී පවුල් වෙත පිවිසෙන නොයෙක් නිලධාරීන් ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියක් ගොඩනගනවා වෙනුවට ප්‍රජාව තුල පවතින සංවර්ධන කටයුතු ද අවධානමට ලක්කරන අවස්ථා ඇත. එනිසා සංවර්ධන වැඩකරුවන්ට අවශ්‍ය මානව දයාව, නිර්මාණශීලිත්වය මෙන්ම, තමා හා ප්‍රජාවගේ දැනුවත්බව ගොඩනැංවීම මෙන්ම, තමන් ජීවත් වන පරිසරය ද ප්‍රජාවගේ ගොඩනැංවීමක්ය, ආදී තත්වයන් රැසක් අවබෝධ කර ගැනීමට වර්තමාන සංවර්ධන වැඩකරුවන්ට මෙම මැදිහත්කරුවාගේ චරිතය බොහෝ කරුණු කියාදෙයි.

ප්‍රජාවගේ සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එය සාමූහිකත්වය කේන්ද්‍ර කොට ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙස දක්නට ලැබේ. සාමූහිකත්වය පවුල තුළින් ආරම්භවී අන්තර් පවුල්, ප්‍රජා සංවිධාන, ප්‍රජා සංවර්ධනය උදෙසා කැපවන සංවර්ධන ක්‍රියාකාරීන් හා එකී ආයතන ද, පුළුල් සමාජය ද ආවරණය කරමින් ගොඩනැගිය යුතු තත්වයකි. විපර්යකාරක වැඩසටහන තුළින් සාමූහිකත්වය ඉස්මතු කොට ජීවන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධමත් බව අවදි කොට ඔවුන් සතු මානව හා භෞතික සම්පත් හඳුනාගෙන, එම සම්පත් භාවිත කරමින් අකර්මන්‍ය වූ සංවර්ධන ක්‍රියාවලිය නැවත ප්‍රතිනිර්මාණය කළ හැකි බව විපර්යකාරක ක්‍රියාදාමය තුළ තහවුරු කර පෙන්වා ඇත. සමාජ අකර්මන්‍යතාව හා අනවබෝධය අවබෝධය තුළින් පහ කරන්නටත්, සමාජයේ ගාමක බලය වූ සාමූහිකත්වය සංවර්ධන මෙවලමක් ලෙස යොදාගැනීමටත් විපර්යකාරක වැඩසටහන ඉටුකළ මෙහෙය ග්‍රාමසංවර්ධනයට හෝ දිළිඳුකට පිටුදැකීමේ වැඩසටහන්වලට සීමා විය යුතු නොවේ. වර්තමානයේ අප මුහුණුපා සිටින ප්‍රධාන ගැටලු හා අර්බුද පුළුල්ව අවබෝධ කර ගැනීම මෙහි දී ඉතා වැදගත් වේ. අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකා අතර සාමූහිකත්වය නැතිවී යාම හා අනවබෝධය වර්තමානයේ අප මුහුණදී සිටින සියලු ප්‍රශ්න, ගැටලු හා අර්බුදවලට ප්‍රධාන හේතුවකි. අපරාධ, දූෂණ, මංකොල්ලකෑම්, මිනීමැරුම්, අනෙකා සතු දේ උදුරාගැනීම්, සැමියා, බිරිඳ, දරුවන් මරාදැමීම්, අනිසි ලෙස බලය භාවිත කිරීම්, මහජන ආයතන විනාශ කිරීම් මෙන්ම අනෙකා සතු ජීවත්වීමේ අයිතිය අභියෝගයට ලක්කිරීම් මෙම සාමූහිකත්වය බිඳවැටීම නිසා සිදුවන්නකි. විපර්යකාරක වැඩසටහනේ මැදිහත්වීමේ ක්‍රියාදාමය හරහා සමාජ ප්‍රගමනයට හිතකර ලෙස සියලු තත්වයන් ප්‍රතිනිර්මාණය කරන නිසා වර්තමාන සමාජයට මෙම ක්‍රමවේදය බෙහෙවින් වැදගත් වේ.

1978 වසරේදී විපර්යකාරක වැඩසටහන ආරම්භ වන්නේ දිළිඳුකම පිළිබඳ සමාජ ගැටලුවට තිරසාර විසඳුමක් ලබාගැනීමේ අපේක්ෂාවෙනි. මෙම දශකය වන විට ආසියාවේ බොහෝ රටවල දිළිඳුකම ප්‍රභල සමාජ අරබුදයක් බවට පත්ව තිබුනි. මේ පිළිබඳව එම රටවල සමාජ හා ආර්ථික විද්වතුන් විසින් සමාජ කතිකාවක යෙදුන අතර, එහිදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බැංකොක් නුවර පිහිටි සංවර්ධන අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය මූලිකත්වය ගෙන ක්‍රියාත්මක විය. මෙම වැඩසටහනට මූලිකත්වය ගත් විද්වතුන් විසින් මෙම ක්‍රියාදාමය හඳුන්වනු ලැබුයේ ග්‍රාමසංවර්ධනය පිළිබඳව වූ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන වශයෙනි. සමාජ පර්යේෂණ වැඩසටහන් පිළිබඳව සැලකීමේ දී එක් සමාජ ගැටලුවක් පදනම් කර ගෙන කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය සිදුවේ. එයින් හඳුනාගන්නා දෑ පසුව ක්‍රියාකාරී සමාජය සඳහා ගලපාගැනීම සිදුවේ. විපර්යකාරක වැඩසටහන තුළ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ ක්‍රියාදාමය අන්‍යොන්‍ය වශයෙන් ඒකාබද්ධව සිදුවේ. එය සෙසු සංවර්ධන ප්‍රවේශයන් ගෙන් වෙනස් වන්නේ මෙම ලක්ෂණය මගිනි. විපර්යකාරක වැඩසටහනේ මූලික බලකනු දෙක ස්වශක්තිය හා සහභාගිත්වයයි. ස්වශක්තිය යනු පුද්ගලයා සතු මානව බලය හා මානව ගුණය හඳුනාගැනීම හා එය භාවිත කිරීමයි. විපර්යකාරක වැඩසටහන මගින් මෙම මානව ගුණය හා බලය පුබුදුවාලීමට මැදිහත්වීමට ක්‍රියාත්මක වන නිසා විපර්යකාරක ප්‍රවේශය මනෝ විද්‍යාත්මක සංවර්ධන ක්‍රමවේදයක් වේ. සහභාගිත්වය යනු සමාජයට හා එහි ක්‍රියාවලියට සම්බන්ධවීමයි. සෙස්සන් හා එක්ව සංවර්ධනය සඳහා සාමූහිකව නව සමාජ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. සාමූහිකත්වය යනු සමාජ යහ පැවැත්මේ ගාමක බලවේගය බව ටී. ආර්. බැටන් විසින් 1949 දී ප්‍රජා සංවර්ධනය න්‍යාය නම් කෘතිය තුළින් දක්වා ඇත. එකිනෙකාට ඇහුංකන්දීම, ගෞරව කිරීම හා ප්‍රතිචාර දැක්වීම මගින් සාමූහිකත්වය නිර්මාණය වේ. මෙම සාමූහිකත්වය සහභාගිත්වයට පදනම වන නිසා විපර්යකාරක වැඩසටහන සමාජ විද්‍යාත්මක පදනමක් මත ක්‍රියාත්මක වේ. මෙවන් පදනමක් මත විපර්යකාරක වැඩසටහන දශක දෙකක් පුරා රාජ්‍ය අනුග්‍රහය හා විදේශීය ආයතනවල උපදෙස් හා මූල්‍ය අනුග්‍රහය සහිතව ද විද්වතුන්ගේ මගපෙන්වීම් යටතේ ක්‍රියාත්මක වූ අතර, එය සමස්ත ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයට මෙන්ම ජාතික සංවර්ධන ක්ෂේත්‍රයට නොයෙක් උපාංග එක් කිරීමට ද කටයුතු කර ඇත. 1998 වසරෙන් පසුව සෘජු රාජ්‍ය අනුග්‍රහය නිමවීමෙන් පසුව ස්වයං ගමනකට අවතීර්ණ වෙමින් විවිධ ප්‍රජා සංවිධාන ගොඩනංවා ගනිමින් ග්‍රාමීය, ප්‍රාදේශීය හා ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක සංවර්ධන සංවිධාන ජාලයකින්ද සමන්විතව ක්‍රියාත්මක වන අතර, මෙම ක්‍රමවේදය අනුගමනය කරමින් ගොඩනැගුණු විවිධ රාජ්‍ය නොවන සංවිධාන ද මේ වන විට පවතී. එකී ආයතන විසින් ප්‍රජාවගේ සංවර්ධනය අත්කරදීම සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දායක වේ. මෙලෙස ගොඩනැගී ඇති මෙම ප්‍රජා මූල සංවිධාන ජාලය තුළ ක්‍රියාත්මක ප්‍රජා සංවිධාන විවිධ මට්ටමින් ක්‍රියාත්මකව පවතින අතර, රාජ්‍ය නොවන සංවිධාන ද මේ ආකාරයෙන් ම ක්‍රියාත්මක වේ.

වර්තමාන සමාජ ආර්ථික අර්බුදයන් හමුවේ එයට මුහුණුදීම සඳහා අවශ්‍ය ශක්තිය ප්‍රජාව තුළ යලි පුබුදුවාලීමේ කාර්යභාරය සඳහා විපර්යකාරක වැඩසටහනින් මහත් පිටිවහලක් ලබා ගත හැක. ප්‍රජාවගේ

චින්තනය යලි ගොඩනංවාලමින් ඔවුන් තුළ එකිනෙකාට ගරුකරන ලෙන්ගතුකම වර්ධනය කරමින් සාමූහිකත්වය සංවර්ධනය උදෙසා ඇතිකරලීමත්, සියලු පාර්ශවයන් අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුත් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ කටයුතු කිරීම සඳහා විපර්යකාරක වැඩසටහන කියා දෙනුයේ මහත් පාඩමකි. එබැවින් වර්තමානයේ මුහුණුදී සිටින සමාජ ආර්ථික අභියෝගයන් සඳහා හුදකලාව එක් පාර්ශවයකට හෝ පමණක් විසඳුම් සෙවිය නොහැකි බව අවබෝධ කර ගත යුතුව ඇත. මෙම අභියෝගයන්ට සාර්ථකව මුහුණුදීම සඳහා විපර්යකාරක වැඩසටහනින් ගත හැකි පාඩම් බොහෝමයක් පවතී. යම් සමාජයක, ප්‍රදේශයක හෝ රටක මුහුණුදී ඇති සංවර්ධන අභියෝග, ගැටලු හෝ අර්බුදවලට සාර්ථකව මුහුණුදීම සඳහා අදාළ ප්‍රජාව තුළ ගොඩනැගෙන සාමූහිකත්වය එකී තත්වයන් ජයගැනීමේ ප්‍රධාන මෙහෙයුම් බලවේගයයි. ප්‍රජා නායකත්ව ක්‍රියාවලිය පහසුකරලීම සඳහා ප්‍රජාව තුළ ගොඩනැගෙන සාමූහිකත්වය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පවුලේ සංවර්ධන ක්‍රියාකාරිත්වය සඳහා ගොඩනැගෙන පවුලේ සාමූහිකත්වය අන්තර් පවුල්, ප්‍රදේශ මෙන්ම පුළුල් සමාජය කරා ද විහිදුවාලීම සිදුවිය යුතුය. එසේම අඩු ආදායම්ලාභී පවුල්වල සංවර්ධනය සඳහා අවශ්‍ය සියලු ආකාරයේ සේවාවන් සැපයීම එකී පවුල්වල සංවර්ධනය වේගවත් කිරීමට විශාල පිටුබලයක් සපයයි. මෙමගින් සංවර්ධනාභිමුඛ ප්‍රජාවගේ සෑම අංශයකම ගොඩනැගෙන තත්වයන් සපුරාගත හැකි වේ. එහිදී ප්‍රජාව සතු ශක්තීන්, හැකියාවන් ඵලදායී ලෙස සංවර්ධනයට යොදාගැනීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කරයි. මෙම ක්‍රමවේදය තුළ ක්‍රියාත්මක වන මැදිහත්කරු ප්‍රවේශය මගින් ප්‍රජාව තුළ  ගොඩනැගෙන දැනුවත්බවත්, සංවර්ධනය සඳහා ඔවුන්ගේ සක්‍රීය සහභාගිත්වයත් ලබාගැනීමට ප්‍රභල මෙහෙවරක් ඉටු කරයි. එබැවින් සංවර්ධනය විය යුතු සමාජ කණ්ඩායම් සංවර්ධනයේ කතෘන් බවට පත්කිරීමේ හැකියාව මෙම සංවර්ධන ප්‍රවේශය මගින් මේ වන විට සනාථ කර ඇත.

# විපර්යකාරක වැඩසටහන වර්තමානයේ මුහුණපාන අභියෝග.

ඒ. එම්. එස්. අතපත්තු
ජ්‍යෙෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි

**වැඩසටහන හා ක්‍රමවේදය මතුකිරීම.**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා බැඳුණු විවිධ මානයන් ඔස්සේ පැන නැගුණු ගැටලු නිවාරණය සඳහා විවිධ ක්‍රමෝපායන් භාවිත කර ඇති බව තොරතුරු ගවේෂණය තුළින් අප හට අවබෝධ කරගත හැකි වේ. 1930 දශකයේ සිට 1948 වර්ෂය දක්වා වූ දශක දෙකක යටත් විජිත පාලන කාලය තුළත්, ආහාර, පෝෂණය, ඉඩම් හිඟය, කෘෂිකර්මාන්තය හා කර්මාන්ත සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් ආදී සමාජ ආර්ථික සංවර්ධනයට අදාළ විවිධ සංවර්ධන වැඩසටහන් රාජ්‍යය මැදිහත්වීම මත සිදු කර ඇත. එසේම 1948 වර්ෂයේ ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් නිදහස් වූ දා පටන් අද වන තෙක්, ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීම සඳහා විවිධ උත්සාහ සොයා ඇතිමුත්, අද වන විටත් ජාතියක් වශයෙන් අපි මුහුණපා සිටින්නේ සංවර්ධන පරිණාමයේ ප්‍රාථමික අවධියක වීම කණගාටුවට කරුණකි.

1970 දශකය වන විට ශ්‍රී ලංකාව මෙන් ම යටත් විජිත පාලනයෙන් මිදුණු බොහෝ ආසියාතික රටවල ප්‍රධාන ගැටලුවවී තිබුණේ දුප්පත්කම හා බැඳුණු අනුශාංගික අභියෝගයන්ය. යටත්විජිත වාණිජ කෘෂිකර්මාන්තය මත පදනම්වූ ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ දරිද්‍රතාව, අගහිඟකම හා සමාජ ආර්ථික විෂමතාව උපරිම මට්ටමට ළඟාවී පැවති අතර, ඒ සඳහා විසඳුම් ලෙස විවිධ ආර්ථික සාධනයට උපකාරී වන සමාජ සුබසාධන වැඩසටහන් හා යටිතල පහසුකම් රාජ්‍ය යාන්ත්‍රණය පෙරටුකරගත් ව්‍යුහයන් ඔස්සේ සපුරා තිබුණි. නමුත් සහනාධාර වෙනුවෙන් රජයට අඛණ්ඩව දැරීමට සිදු වූ අධික පිරිවැය, විදේශ ණය, ගෙවීම් ශේෂ ගැටලුව, දේශීය නිෂ්පාදනය පහළ මට්ටමක පැවතීම, දරිද්‍රතාව, අධික ජනගහන වර්ධනය, සේවා වියුක්තිය, තරුණ අසහනය සහ සමාජ කැළඹිලි උච්චස්ථානයට පැමිණ තිබුණි. මෙවැනි බොහෝ තත්ත්වයන්ට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වැරදි හා නොගැලපෙන රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය කළමනාකරණ පිළිවෙත් වූ හෙයින්, පැවති සංවර්ධන යන්ත්‍රයේ අසමත්කම පසක්වී තිබුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් සුවිශේෂ වූවක් නොව, දකුණු ආසියාව, ශාන්තිකර හා පැසිපික් කලාපයේ පොදු තත්ත්වයක් බැවින්, මීට විසඳුම් සෙවීමේ නව මානයක පිළිබිඹු පහළ වී තිබුණි.

1970 දශකයේ ශ්‍රී ලංකාවේ පමණක් නොව, ආසියානු කලාපය පුරා දිළිඳුකම තුරන්කිරීමේ වැඩසටහන් පිළිබඳ උද්යෝගයක් ජනිත වූ අතර, ඒ අතරින් බැංකොක් හි පිහිටි එක්සත් ජාතීන්ගේ ආසියානු ශාන්තිකර සංවර්ධන ආයතනය ප්‍රමුඛස්ථානයේ සිට කටයුතු කරන ලදී. 1978 අප්‍රේල් 17 - 21 දක්වා කාලය තුළ සංවර්ධන පරිපාලන ආයතනයේ දී ආචාර්ය; පොන්න විග්නරාජා, ජී. වී. ඒස්. ද සිල්වා හා නිරංජන්මේතා යන සමාජ විද්‍යාඥයින්ගේ මෙහෙයවීමෙන් “න්‍යායට වහල් නොවී ගතානුගතිකත්වයෙන් මිදී ග්‍රාම සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික අත්හදාබැලීම් සියුම් ලෙස ගැඹුරින් විමසා ඉන් මතුවන යථාර්ථය පදනම් කරගෙන ග්‍රාම සංවර්ධනය පිළිබඳ නව සංකල්පයක්” ගොඩනගා ගැනීමට සමත්විය(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 1981). “දුප්පතුන් සජීවීකරණයෙන් ඔවුන් තුළ දැනුවත්භාවය ඇති කිරීමට ඇති හැකියාව” පිළිබඳ පෝලෝ ෆේරි විසින් රචිත “pedagogy of the

oppressed"(1970) කෘතියේ සඳහන් සිද්ධාන්ත හා දකුණු ආසියාවේ කාලයක් තිස්සේ එම ප්‍රවේශය යොදා ගනිමින් කරතිබූ අත්හදාබැලීම් නව සංවර්ධන ප්‍රවේශයක් ගොඩනගා ගැනීමට ඉවහල් විය. මෙම සිද්ධාන්තය ක්‍රමවේදයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රායෝගික භාවිතාව, කාර්යබද්ධ පුහුණු පර්යේෂණයක් ලෙස ක්‍රියාවට නැංවූ අතර, එය පසුකාලීනව විපර්යකාරක වැඩසටහන ලෙස නාමකරණයට හා සංකල්පීයකරණයට භාජනය විය(විග්නරාජා; 1991). විපර්යකාරක ක්‍රමවේදය යනු සමාජයේ සැබෑ වෙනසක් සිදු කිරීම සඳහා දිළිඳු ප්‍රජාව ඥානනය කිරීමේ ක්‍රියාවලියකි. අනාදිමත් කාලයක් පුරා සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ, වරප්‍රසාද හිමි ප්‍රජාව තුළ පැවති පසුගාමී මානසිකත්වය වෙනස්කිරීම සඳහා ඔවුන් සවිඥානය කිරීම හා ඒ තුළින් යටපත් වූ ශක්තිය පුබුදුවාලීම මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රමෝපායක් විය. දිළිඳු ප්‍රජාව නිෂ්පාදනයේදී, අලෙවියේදී, පරිභෝජනයේදී හා ණය ක්‍රියාවලියේදී මුහුණපාන අවාසිදායක තත්ත්වය විශ්ලේෂණය කර, එය වඩා වාසිදායක තත්ත්වයට පරිවර්තනය කර ගැනීමට මැදිහත්කරුවෙකුගේ(උත්ප්‍රේරකයකුගේ) මඟ පෙන්වීම මත සිදුකරන ලද දැනුවත් වීමේ ක්‍රියාවලිය "සමාජ සජීවීකරණය" මෙහි ප්‍රධාන මෙවලමකි.

සජීවීකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රජාවට මග පෙන්වීම සිදු කරනු ලබන්නේ විපර්යකාරකයා බැවින්, ඔහු සමාජයේ සැබෑ වෙනසක් සිදුකිරීම සඳහා මැදිහත්වන්නකු ලෙස ද අර්ථ ගැන්වේ. උත්ප්‍රේරක මැදිහත්කරුවා ගොඩනැඟීම සිදු කරනු ලබන්නේ ප්‍රජාව සමග කරන ලද කාර්යබද්ධ මැදිහත්වීමක් තුළිණි. මෙම මැදිහත්වීමේ ක්‍රියාවලියේ දී ප්‍රජාව මෙන්ම මැදිහත්කරුවා විසින් ද, පවතින අවාසිදායක සමාජ ආර්ථික යතාර්ථය මැනවින් හඳුනාගන්නා අතර, ඒ සඳහා සහභාගිත්ව විමර්ශන ක්‍රියාවලියක නිරත වේ. විපර්යකාරකයින් ගොඩනැංවීමේ ක්‍රමවේදය කාර්යබද්ධ ක්‍රියාවලියක් තුළ සිදුවන අතර, එය මූලික අදියර 12ක් ඔස්සේ සිදුවේ. මෙම අදියර නිමවන විට අකර්මාණ්‍යව සිටි දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් ස්වයං සවිබලගැන්වීම මේ ක්‍රියාවලියකට අවතීර්ණ වේ. එසේම විපර්යකාරක වැඩසටහනේ ගමන් මග දෙස බලන කළ එය අදියර පහක් ගමන් කොට වර්තමාන තත්ත්වයට රූපාන්තරණයවී ඇත.

**පළමුවන අවධිය: විපර්යකාරක වැඩසටහන පර්යේෂණාත්මක අවධිය(1978 - 1982)**

විපර්යකාරක වැඩසටහනේ මූලික සංකල්ප අත්හදා බලමින් හා අත්දැකීම් තුළින් ඉගෙනගත් අවධිය මීට ඇතුළත් වන අතර, විපර්යකාරකයා හා පුහුණුකරුවා පුහුණුකිරීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම, පර්යේෂණ ගම්මාන තෝරා ගැනීම, ග්‍රාමීය කණ්ඩායම් ගොඩනැගීම, ඉලක්ක කණ්ඩායම්වල ප්‍රගතිය හා ආර්ථික ක්‍රියාකාරකම් තුළ රඳවාගැනීම, ගම තුළ පවතින සම්බන්ධතා අධ්‍යයනය කිරීම, සන්නිවේදනය හා වැඩසටහනට සම්බන්ධ වූවන් අතර අත්දැකීම් හුවමාරුව මෙම අදියර තුළ සිදුවිය(රත්නවීර 1990).

**දෙවන අවධිය: ගැටලු සහගත අවධිය(1982 – 1984).**

මෙම අවධිය තුළ වැඩසටහනට උපදේශකත්වය සැපයූ ආධාරක ආයතනය ඉවත් වූ අතර, ආධාර ගලා ඒම අඛණ්ඩව සිදු නොවීම, සම්බන්ධීකරණය හා සහභාගීත්වය වෙනස්වීම, වැඩසටහන ඒකාකාරීව සිදු නොවීම සහ අධීක්ෂණ කටයුතු විධිමත් පරිදි සිදු නොවීම හේතුවෙන් වැඩසටහනේ අඛණ්ඩ බවට බාධා ඇතිවිය(සිල්වා, 2003).

**තෙවන අවධිය: විපර්යකාරක වැඩසටහන සංවර්ධන අවධිය 1984 1986**

විපර්යකාරක වැඩසටහන අරමුණු කේන්ද්‍රීයකරණයට හා සංවිධාන ව්‍යුහයකට ගෙන ඒමට අවශ්‍ය වූ අතර, ඒ සඳහා විපර්යකාරකයින්ගේ, පුහුණුකරුවන්ගේ හා කණ්ඩායම් සාමාජිකයින්ගේ ආකල්ප හා සිතුම් පැතුම් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය ඇතිවිය. කළමනාකරණය විසින් කාර්යක්ෂම ඇගයුම් හා මෙහෙයුම් යාන්ත්‍රණයක්

සංවර්ධනය කළ අතර, ඒ තුළින් වැඩසටහනේ අරමුණ ලඟාකර ගැනීම සඳහා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකි විය.

**සිව්වන අවධිය: වෙනස්වීම් මත විතැන් වූ අවධිය (1986 – 1989).**

අරමුදල් සම්පාදන ආයතවල දායකත්වය ඇතිව නව කළමනාකරණ ක්‍රම හඳුන්වා දෙමින් ක්‍රියා ක්‍රියාකාරකම් බහුවිධකරණයට ලක්විය. සජීවිකරණ පුහුණුවේ හරයාත්මක බව පෝෂණය කරමින්, බාහිර උපදේශකයින්ගේ සහය මත කළමනාකරණ හා මෙහෙයුම් යාන්ත්‍රණය ශක්තිමත් කර ගැනීමට හැකි විය. නමුත් පූර්ණ කාලීන පුහුණුකරුවන් වැඩසටහනින් ඉවතවීම හා දකුණේ ඇති වූ සිවිල් යුද වාතාවරණය හා අරමුදල් අතින් ශක්තිමත් කුඩා කණ්ඩායම් ඒවා වෙනත් අවශ්‍යතා ඔස්සේ වැය කිරීම නිසා වැඩසටහන පසුගාමී තත්ත්වයට පත් විය.

**පස්වන අවධිය: විපර්යකාරක වැඩසටහන ව්‍යාප්තිය අවධිය 1990 - 1994**

ශ්‍රී ලංකාවේ දිළිඳුකම අවමකිරීම සඳහා ආරම්භ කරන ලද ප්‍රථම වැඩසටහන වන ජන සවිය වැඩසටහනට(1989) විපර්යකාරක ක්‍රමවේදයේ සජීවිකරණ ක්‍රියාවලිය ගලපාගත් අතර, එහි සාර්ථකත්වයත් සමඟ ව්‍යාප්තිය පුළුල් විය. විපර්යකාරක ක්‍රියාවලිය කුඩා කණ්ඩායම හා මධ්‍ය ගම තෙක් ව්‍යාප්තිය සීමානොවී එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික්කය හා ජාතික මට්ටම දක්වා පැතිරුණි( සිල්වා; 2003).

1998 වර්ෂය වනවිට ව්‍යාපෘති කාලය නිමාවට පත්වූ අතර, එවකට කාර්ය ස්ථාය ස්ථාන 64ක ක්‍රියාත්මක වූ වැඩසටහන ප්‍රජාශක්ති සංවිධානය 52 ක් වටා ව්‍යුහගත වූ අතර, ඒවා ස්වයං කළමනාකරණ ඒකක බවට පරිවර්තනය විය. මෙම කළමනාකරණ පරිවර්තනයත් සමග ඒවායේ එතෙක් පැවති ඒකීය ස්වරූපය, ඒ ඒ සංවිධානවල මූලිකයින්ගේ අවශ්‍යතාව හා හැකියාව අනුව බහුවිධ මුහුණුවරක් ගන්නා ලදී. අධීක්ෂණය, පසුවිපරම හා උපදේශකත්වය ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සීමාවන්ගෙන් ලිහිල් වූ හෙයින් සංවිධාන තුළ කළමනාකරණ ගැටලු පැනනැගුණි. මූලික පුහුණුකරුවන් එම සංවිධානවලින් ඉවත්වීමෙන් පසුව ඒ වෙනුවට පත්වූ දෙවන පෙළ අපරිණත නායකත්වය මෙම ගැටලුවට හේතු විය. මුලින් ආරම්භ කළ ප්‍රජාශක්ති සංවිධාන 52, 2008 වර්ෂය වනවිට සංවිධාන 27 දක්වා අඩුවිය(අතපත්තු; 2013). වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ සක්‍රීය තත්ත්වයේ ප්‍රජාශක්ති ශක්ති සංවිධාන 12 ක් පමණක් ක්‍රියාත්මකවීම, විපර්යකාරක වැඩසටහන අභියෝගයට ලක් වූ බවට හොඳම සාක්ෂියකි. නමුත්, 1978 වර්ෂයේ ආරම්භ කරන ද විපර්යකාරක වැඩසටහන වර්තමානය වනවිටත් විවිධ අභියෝගවලට ලක්වෙමින්, රාජ්‍ය හෝ වෙනත් ආධාරක ආයතනවල සහායෙන් තොරව තවදුරටත් ක්‍රියාත්මක වීම හා රාජ්‍ය අනුග්‍රහයන් තුළින් මෙම අරමුණින්ම ක්‍රියාත්මක වූ වැඩසටහන්වල ශේෂයන්ගෙන් තොරව නිමාවට පත්වීම අතර ක්‍රමවේදී වශයෙන් මේ තුළ පැවති ශතිමත් බව මනාව ස්ඵුට වේ.

**විපර්යකාරක වැඩසටහනේ වර්තමාන අභියෝග හා ඒ පිටුපස ඇති බලවේග.**

1998 වර්ෂයේ දී ප්‍රජාශක්ති සංවිධාන 64 ක් පැවතුණු අතර, 2008 වර්ෂය වන විට ක්‍රියාකාරී මට්ටමේ ප්‍රජාශක්ති සංවිධාන සංඛ්‍යාව 27 දක්වා අඩුවී තිබුණි. ප්‍රජාශක්ති සංවිධාන මේ ආකාරයෙන් බිඳ වැටීමට විවිධ හේතු බලපා ඇති බව පර්යේෂණ තුළින් සනාථවී ඇත. ඒවා නම්,

1. මූලික පුහුණුකරුවන් හා විපර්යකාරකහින් සංවිධානවලින් ඉවත් වීම.
2. දැනට සිටින විපර්යකාරකයින් හට සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පිළිබඳ ඇති අඩු න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම.

3. මූල්‍ය වංචා හා අක්‍රමිකතා ආදී නොයෙකුත් හේතු නිසා සංවිධානවල පවතින අඩු විනිවිදභාවය.
4. කුඩා කණ්ඩායම් බිඳවැටීම හා ග්‍රාමීය සංවිධාන බිඳවැටීම හේතුවෙන් ප්‍රජා ශක්ති සංවිධාන නඩත්තු කිරීමට හා පවත්වාගෙන යාමට නොහැකි වීම.
5. සජීවීකරණ ක්‍රියාවලිය අඛණ්ඩව ග්‍රාමීය දිළිඳු ප්‍රජාව මුල්කොට ගෙන ක්‍රියාත්මක නොවීම.
6. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සහ ප්‍රජා ශක්ති මහා සංගමය මගින් ප්‍රජා ශක්ති සංවිධාන පිළිබඳ විධිමත් ඇගයුම්, මෙහෙයුම් හා සම්බන්ධීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක නොකිරීම.
7. ප්‍රජාශක්ති ග්‍රාමීය සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල නිලතල එකම පිරිසක් අතර හුවමාරුවීම හා නිලතල වෙනස් නොවීම.
8. ප්‍රජා ශක්ති සංවිධානවල නිලතල දැරූ විපර්යකාරකයින් වෙනත් ව්‍යාපෘති සඳහා සේවයට නික්මයාම හා ප්‍රජා ශක්ති සංවිධාන වෙනත් රාජ්‍ය නොවන සංවිධාන බවට පත්වීම. ආදිය ප්‍රජාශක්ති සංවිධාන පිරිහීමට හා අඩපණ වීමට බලපෑ මූලික හේතු ලෙස හඳුනාගෙන ඇත(කරුණාරත්න; 2009).

පර්යේෂණාත්මක තොරතුරු විවරණය හා අනුගාමීව 2008 වර්ෂයේ දී ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද පර්යේෂණය තුළින් විපර්යකාරක වැඩසටහන මුහුණ දෙන වර්තමාන අභියෝග පිළිබඳ ප්‍රධාන තේමාවන් තුනක් ඔස්සේ කරුණු අනාවරණය කර ඒ පිළිබඳ විවරණය කර ඇත.

**අ. ක්‍රමවේදය මූලික ස්වරූපයෙන්ම ගැලපීමේ උත්සාහය.**

සහභාගිත්ව සංකල්පය කාර්යබද්ධව අත්හදා බැලීමත් තුළින් සහභාගිත්ව සංවර්ධන පිළිබඳ ක්‍රමවේදයක් ගොඩ නැගීමට පර්යේෂණාත්මක අවධිය තුළ දැඩි වෙහෙසක් ගත් අතර, එහිදී සංකල්පය ක්‍රියාවට නගන ලද්දේ ආවෘත්ත සරල සමාජ ආර්ථික පසුබිමකට අනුරූපී ලෙසයි. වැඩසටහන ආරම්භවී දැනට අවුරුදු 48 කට ආසන්න කාලයක් ගත වුවත්, වර්තමාන සමාජ ආර්ථික විචලයන්ට අනුරූපීව ක්‍රමවේදයේ සංවර්ධනයක් සිදු නොවීම ප්‍රධාන ගැටලුවකි. ක්‍රමවේදයේ හරය හෙවත් සාරය කොතරම් පොහොසත් වුවත් භාවිත පියවරයන් වර්තමාන ගතික සමාජ ආර්ථික විචලනය ග්‍රහණය කර ගැනීමට අපොහොසත්වී ඇත. ක්‍රමවේදය ගොඩනගන අදියර තුළදී ප්‍රජාව පිළිබඳ ගොඩනහා තිබූ නිර්ණායක නූතන සමාජය තුළ ප්‍රායෝගිකව දක්නට නැත. ඒ අනුව ප්‍රජාව අර්ථ නිරූපණය සඳහා ගොඩනහාගත් පරිකල්පන රාමුව අදට වලංගු නැත. දීර්ඝ කාලයක් තිස්සේ බාහිර පුද්ගලයකු හෝ ආයතන විසින් පිටතින් සැලසුම්කර ගමට ගෙන එන සංවර්ධන වැඩසටහන් රාජ්‍ය ධූරාවලිය තුළ ඉහළ සිට පහළට දිවෙන යාන්ත්‍රණයක් තුළ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එකී වැඩසටහන් වල කර්තෘන් විය යුතු ප්‍රජාව කර්මය බවට පත්වී ඇති බවටත්, එකී ප්‍රජාව පවතින සංවර්ධන ප්‍රවාහයෙන් කොන්වී ස්වශක්තිය බවට පත්වී ඇති හෙයින් ඔවුන්ගේ සැඟවුණු ශක්තිය පුබුදුවා දීම සඳහා සජීවීකරණ ක්‍රියාවලිය භාවිත කිරීම තුළ ඔවුන් ජීවිතයේ සැබෑ යථාර්ථය මතු කර ගැනීමට පෙළඹෙන බවත්, ඒ තුළින් දැවෙන ගැටලුවලට විසඳුම් සොයා ගන්නා බවත්, පර්යේෂණාත්මකව හඳුනා ගන්නා ලදී. නමුත් මෙම සජීවීකරණ ක්‍රියාවලිය අද සමාජය තුළ එයාකාරයෙන් භාවිත කිරීමේ ගැටලු පැන නැගී ඇත. එයට ප්‍රධාන හේතුවවී ඇත්තේ සමාජය පිළිබඳ එදා පැවැති කල්පිත අද වෙනස්වී තිබීමයි. සරල සමාජය තුළ පවතින යතාර්ථය මතුකර ගැනීමට විමර්ශන ක්‍රියාවලිය තුළ නිමග්නවීම සඳහා ප්‍රජාවට අසීමිත කාලයක් ගතකිරීමේ හැකියාව පැවතුණත්, අද සංකීර්ණ සමාජය තුළ කෙටි කාලයකටවත් කතිකාවක් ගොඩනගා ගැනීම අසීරුවී ඇත. එසේම එදා සමාජය තුළ මිනිසුන්ට තිබූ සංනිවේදන සීමා සහිත වූ හෙයින් ම මැදිහත්කරුවාගේ සන්නිවේදනය ප්‍රබල මාධ්‍යයක් බවට පත්වූවත්, අද සමාජය තුළ ඒ ආකාරයෙන් රඳවා ගැනීම අසීරු වී ඇත. එදා ප්‍රජාවට සීමාසහිත අවශ්‍යතා සපුරා ගැනීමේ උවමනාවක් පැවතියත්, අද ප්‍රජාවගේ අවශ්‍යතා සංකීර්ණවී ඇති අතර, ඒවා තෘප්තකර

ගැනීම සඳහා දැඩි කැප කිරීමක් අවශ්‍යව ඇත. ක්‍රමවේදීය වශයෙන් ප්‍රජාව බලගැන්වීමේ චිරස්ථායි පියවර පැවැතියත්, අද එවැනි දේ සඳහා ප්‍රජාවගේ රුචිය හීන තත්ත්වයක පැවතීමට හේතුවී ඇත්තේ ලිබරල්වාදී ආර්ථික ක්‍රමය තුළ ආර්ථික වශයෙන් ශක්තිමත් වීමේ විවිධ අවස්ථාවන් පවතින හෙයිණි. එහෙයින් අවිවේකී ග්‍රාමීය සමාජය තුළ ප්‍රජාව ඥාණනය නැතහොත් විඥානය පුබුදුවාලීමේ හා දැනුවත් කිරීමේ ක්‍රමශිල්ප දියුණු කළ යුතුව ඇත. එසේම සරළ සමාජයට අනුගත ක්‍රම වෙනුවට සංකීර්ණ හා ගතික සමාජය තුළ ප්‍රජාව දැනුවත් කිරීමේ තාක්ෂණික හා විද්‍යාත්මක අංගයන්ගෙන් යුත් ශිල්ප භාවිත කළ යුතුයි.

විපර්යකාරක ක්‍රමවේදය තුළ ස්වශක්තිය, සහභාගිත්වය හා විපර්යකාරකයා යන්න අත්‍යන්තයෙන්ම ප්‍රධාන බලකණු බව තහවුරුකර ඇත. ප්‍රජාව බල ගැන්වීමේදී ශක්තිය ලෙස විග්‍රහකරන ලද්දේ භෞතික ශක්තිය, මානව ශක්තිය හා සංවිධාන ශක්තිය යන ශක්ති ත්‍රිත්වයේ එකතුවක් වුවත්, අද සමාජය තුළ ඒවාට ඇති වැදගත්කම, එහි අවශ්‍යතාවය සහ විශ්වාසය පහත් මට්ටමක පවතී. ඊට හේතුව වන්නේ ඒ තුළින් ලබාගන්නා ජවය වෙනත් විකල්ප මාර්ග ඔස්සේ ඉතා පහසුවෙන් ලබා ගැනීමට හැකි බවට ප්‍රජාව තුළ පවතින විශ්වාසයයි. ක්‍රමවේදයේ වලංගු බව හීන වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ වැඩසටහනට මෑත කාලය තුළ සම්බන්ධ වූවන් හට ඒ පිළිබඳ ඇති අවබෝධය, විශ්වාසය හා ප්‍රවීණත්වය පහළ මට්ටමක පැවතීමයි. බොහෝ ප්‍රජාශක්ති සංවිධාන මෙහෙයවන කළමනාකරණ මට්ටමේ මැදිහත්කරුවා පවා විපර්යකාරක ක්‍රමවේදය ප්‍රගුණ කර ඒ පිළිබඳ පරිචයක් හිමිකරගෙන නැත. මැදිහත්කරුවන් ගොඩනැගීමේ යාන්ත්‍රණය අද දවසේ වැඩසටහන තුළ නොතිබීම හා ඒ සඳහා වගකිව යුතු ආයතනයක් හෝ සංවිධානයක් නොමැතිවීම ම මීට තව ප්‍රබල හේතුවකි. 1998 වර්ෂය වන තෙක් මෙම කාර්යය ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් වගකීමක් ලෙස ඉටු කරනු ලැබුවත්, අද වන විට එම ආයතනය ප්‍රායෝගික තලයේ බිම් මට්ටමේ ක්‍රියාවන්ට සම්බන්ධ නොවේ.

විපර්යකාරක වැඩසටහන තුළ විස්තර කරන දුගී පන්තිය කෙරෙහි කැක්කුම, සමාජ සාධාරණත්වය, යුක්තිය හා සමානාත්මතාවය සඳහා පෙනී සිටීමේ මානසිකත්වයෙන් යුත්, දිළිඳු ප්‍රජාවට අහිමි වූ බලය හිමිකර දීම සඳහා සමාජ යථාර්ථය පිළිබඳ විද්‍යාත්මක විග්‍රහ කරන, ආත්ම විශ්වාසයෙන් සමන්විත ගති ලක්ෂණ හෙබි මැදිහත්කරුවන් ගොඩනැගීම මෙම සමාජ ආර්ථික සන්දර්භය තුළ ඉතා උගහට කාරණයකි. ඊට හේතුව සමස්ත සමාජයම පරාර්ථකාමිත්වයෙන් විතැන්වී කෙටි මාර්ගවලින් තම ආර්ථික ශක්තිය වර්ධනය සඳහා පෙළඹෙන හෙයිණි. එහෙයින් වැටුපකින් තොරව අඛණ්ඩව මෙවැනි බැරෑරුම් කාර්යයක මැදිහත්කරුවන් නිරත කිරීම අසීරු වී ඇත.

**ආ. සංවිධානතලය පිටුපස ඇති යථාර්ථය.**

සංවිධාන ගතවීම යන්න, "කාර්යභාරය පුළුල් වන විට සංවිධාන තලය පුළුල් විය යුතු බව" මෙම ක්‍රමවේදය තුළ අනුදත් අවශ්‍යතාවයක් මෙන්ම, බාහිර අභියෝගවලට එරෙහිව මුහුණදීමට සාමූහික බව ගොඩනංවා ගැනීමේ ක්‍රමෝපායන් ද වේ. තනි තනිව නැඟී සිටිය නොහැකි විට සම නිෂ්පාදන මූලික කරගත් කුඩා කණ්ඩායම් වශයෙන් හෝ, ග්‍රාමීය සංවිධාන, ප්‍රජාශක්ති සංවිධාන, දිස්ත්‍රික් මට්ටමේ සම්මේලන හෝ ජාතික මට්ටමේ සම්මේලන ආදී ස්ථර කිහිපයක් ඔස්සේ සංවිධානගතවී ඇත. මෙම එක් එක් සංවිධාන ස්ථරවලට අපේක්ෂිත අරමුණු හා පැවරුණු කාර්ය භාරයක් දක්නට තිබුණි( සිල්වා 2003).

දිළිඳු ප්‍රජාව සමග විපර්යකාරකයාගේ මැදිහත්වීම මත, තනි තනි වශයෙන් සජීවීකරණය වූ පුද්ගලයෙක් හට තම ගැටලු සඳහා විසඳුම් ගෙන ඒමට නොහැකි විට, සමාන ගැටලු, අවශ්‍යතා හා අභියෝග ඇති පිරිස් සාමූහික බලය

ගොඩනැංවීම සඳහා කුඩා කණ්ඩායම් වටා රොක්වන අතර, ඒවා තුළින්ම පුද්ගලික හා කණ්ඩායමට බලපාන ගැටලු විසඳා ගැනීමට උත්සාහ ගන්නා ලදී. එසේම වැඩසටහනේ අපේක්ෂාව වූයේ තනි තනිව විසඳිය නොහැකි ගැටලුවලට සාමූහිකව උත්තර සෙවීම තුළින් දිළිඳුකමින් එතෙර වීමට ප්‍රාථමික ප්‍රජා සංවිධාන සංවිධානයක් වශයෙන් කුඩා කණ්ඩායම් අත්‍යවශ්‍ය වන බවයි. නමුත් 1998 වර්ෂයෙන් පසු කාලය තුළ කුඩා කණ්ඩායම් ගතවීම සජීවිකරණය වූ සාමාජිකයන්ගේ අවශ්‍යතාවෙන් වියුක්තව, මැදිහත්කරුවාගේ ඉලක්ක හා මැදිහත්වීමේ පහසුව පිණිස ඇති වූ අවශ්‍යතාවක් බව දක්නට ඇත. මුල් කාලය තුළ දුප්පත්කම හා බැඳුණු ගැටලු විසඳාගැනීමට කුඩා කණ්ඩායම් ගත වූවත්, 2013 පමණ විට ප්‍රජාශක්ති සංවිධානයේ ඉලක්ක මත ක්‍රියාත්මක වූ වැඩසටහන් ගමට ගෙන යාමේ යාන්ත්‍රණයක් ලෙස කුඩා කණ්ඩායම් භාවිත කරන ලදී. කල්යත්ම සාමාජිකයාගේ අවශ්‍යතාවෙන් තොරව සංවිධාන අවශ්‍යතා මත කුඩා කණ්ඩායම් හැසිරවීම නිසා එතෙක් කුඩා කණ්ඩායම වටා ගොනු වූ වැඩසටහන් මෙන් ම සාමාජිකයා ද ඉන් ඉවත් වීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. වර්තමානය වනවිට බොහෝ ප්‍රජා ප්‍රජාශක්ති සංවිධානවල කුඩා කණ්ඩායම් සක්‍රිය මට්ටමින් ක්‍රියාත්මක නොවුවද, ණය සඳහා ඇපකරුවන් සම්පාදන මෙවලමක් ලෙස නාමිකව පවත්වාගෙන යනු ලබයි. ඒ වටා සාමූහික ක්‍රියාකාරකම් නිර්මාණයවීමක් හෝ දිළිඳු බවට අභියෝග කරන ක්‍රියාකාරකම් ද දක්නට නැත. මෙයට හේතුව ක්‍රමවේදය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කර නොගැනීම හා සජීවීකරණය සඳහා මඟ පෙන්වන මැදිහත්කරුවන් නොසිටීමයි.

සාමාජිකයාගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කුඩා කණ්ඩායමේ ශක්තිය ප්‍රමාණවත් නොවන විට මෙන්ම, පොදුවේ ග්‍රාම සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය වැනි ගමට පොදු වූ සංවර්ධන කාර්යයන් සඳහා වැඩසටහන් නිර්මාණය කරගැනීම සඳහා ග්‍රාමීය සංවිධාන(ගම් මට්ටමේ එකමුතුව) ගොඩනඟා ගැනීම ක්‍රමවේදයේ විද්‍යාත්මක බව හා ගතානුගතිකත්වයට එරෙහිව ගත් පියවරකි. පහල සිට ඉහලට දිවෙන යාන්ත්‍රණයක් ඔස්සේ තීරණ ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මකවීම රැඩිකල්වාදී නව කළමනාකරණ ශිල්පීය ක්‍රමය, විපර්යකාරක වැඩසටහන ව්‍යාප්ති ව්‍යා අවධිය තුළ සිදු වූවක් වන අතර, අභියෝග බිඳ හෙළීම සඳහා දිළිඳු ප්‍රජාවගේ අවියක් ද විය. නමුත්, 2003 වර්ෂයෙන් පසුව බොහෝ ප්‍රජාශක්ති සංවිධාන ස්වයං ආදායම්කරණයට යොමුවීම හා බාහිර ආධාරක ආයතනවල වැඩසටහන් හා බද්ධවීම, ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුවලට ප්‍රමුඛතාව දීම වැනි සංවිධානයේ පුවත්ම අරමුණුකරගත් වැඩසටහන් හේතුවෙන් ග්‍රාමීය සංවිධානවල ජීව ගුණය වියැකී ගොස් ඇත. අද වනවිට ණය එකතු කිරීම හා ණය සැපයීම සඳහා මෙහෙයුම් යාන්ත්‍රණයක් ලෙස පමණක් ග්‍රාමීය සංවිධාන ක්‍රියාත්මකවීම වැඩසටහන මුහුණපාන එක් අභියෝගයකි.

1978 වර්ෂයේ විපර්යකාරක වැඩසටහනේ ආරම්භක අදියර තුළ ක්‍රියාත්මක වූ කාර්යස්ථාන, 1998 වර්ෂයේදී ව්‍යාපෘතිය නිමවීමත් සමඟ ස්වයංකළමනාකරණය ඒකක බවට පත් වූ අතර, ඒවා තනි තනිව ප්‍රජාශක්ති සංවිධාන හෝ ප්‍රජා ශක්ති බැංකු නමින් ක්‍රියාත්මක වීම ඇරඹුණි. කුඩා කණ්ඩායම් ඉතිරිකිරීම්, කැනඩා සංවර්ධන අරමුදල සහ ප්‍රජා ශක්ති මහා සංගමය තුළින් ලබාගත් සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ලබාගත් ණය, ප්‍රජාව වෙත ණය ලෙස ලබාදීම තුළින් උපයාගන්නා ලාභය මෙකී සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගයවී ඇත. සංවිධානය මෙහෙයවන මැදිහත්කරුවාගේ දක්ෂතා හා නිපුණතා අනුව සංවිධානය ශක්තිමත් වූ අතර, බොහෝ සංවිධානවල නායකත්වය විපර්යකාරක වැඩසටහනේ පුහුණුකරුවන් අතට පත්විය. ඒවා අද වන විටත් ඉතා සාර්ථක මට්ටමින් ක්‍රියාත්මක බව හබරාදුව සහභාගීත්ව සංවර්ධන පදනම, බටපොල ප්‍රජාශක්ති සංසදය හා වැලිගම ප්‍රජාශක්ති සංවිධානය උදාහරණ ලෙස හුවා දැක්විය හැකියි. ඊට අමතරව අනෙකුත් සංවිධානවල කළමනාකාරිත්වය ස්වේච්ඡා පුහුණුකරුවන් යෝ දෙවන පෙළ විපර්යකාරකයින් අතට පත් වූ අකර, ඒවායේ සාර්ථකත්වය යම් අඩු මට්ටමක පවතියි. නමුත් ඒ අතරින්

ක්‍රියාකාරී සංවිධාන ලෙස කුරුවිතැන්න ප්‍රජාශක්ති බැංකුව හා බලවත්තල ආසිරි මානව සංවර්ධන පදනම ඉදිරියෙන් සිටිනමුත්, බොහෝ සංවිධාන අක්‍රීය හෝ නාමික මට්ටමින් ක්‍රියාත්මක වේ. අද වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේ සංවිධාන 12 ක් පමණි. ප්‍රජාශක්ති සංවිධාන මේ ආකාරයෙන් දිනෙන් දින අක්‍රියවීමට විවිධ හේතු බලපා ඇත. විශේෂයෙන්ම අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුවලට යොමු වීම තළින් ඇති වූ පීඩනය මෙන්ම, කළමනාකරුවන් තුළ මෙම ක්‍රමවේදය පිළිබඳ පවතින අඩු පරිචය, නව සමාජ ආර්ථික තත්ත්වය තුළ ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීමට නොහැකිවීම, වංචා දූෂණ බහුලවීම, දෙවන පෙළ නායකත්වයක් ගොඩනොනැගීම, විධිමත් පරිපාලන හා කළමනාකරණ ව්‍යුහය නොපැවතීම, නව සංවර්ධන වැඩසටහන් හඳුන්වාදීමට අපොහොසත්වීම, උපදේශක සේවා වෙත ළඟාවීමේ නොහැකියාව හා අත්තනෝමතික පාලනය ආදී පුද්ගල බද්ධ හා ක්‍රමවේදය ගැටලු සමූහයක් සංවිධාන අඩපණවීමට හේතුවී ඇත.

විපර්යකාරක වැඩසටහනේ දිගුවක් ලෙස කාර්යස්ථාන කීපයක එකතුවක් ලෙස දිස්ත්‍රික් සංවිධාන 1998 වර්ෂය වනවිටත් නිර්මාණයවී තිබුණමුත්, දිස්ත්‍රික් සංවිධාන විදිමත් පරිදි ගොඩනැගී ක්‍රියාත්මක වූයේ බදුල්ල හා ගාල්ල දිස්ත්‍රික් සංවිධාන පමණි. ජනසවි භාරකාර අරමුදල හා ප්‍රජාශක්ති මහා සංගමය මගින් ප්‍රාදේශීය සංවිධානවල ප්‍රාග්ධන අවශ්‍යතාව වර්ධනය සඳහා සහ ග්‍රාමීය ප්‍රජාවගේ ණය අවශ්‍යතා පූර්ණය සඳහා ලබාදුන් බීජ අරමුදල් කළමනාකරණය හා මෙහෙයුම් මෙම සංවිධානවල ප්‍රධාන කාර්යභාරය විය. ඊට අමතරව ප්‍රාදේශීය සංවිධාන වෙත මූල්‍ය උපදේශන හා සංවිධාන කළමනාකරණ උපදේශන පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යභාරය වූ නමුත් කල්යත්ම ප්‍රාදේශීය ප්‍රජාශක්ති සංවිධාන මඟින් ලබාගත් ණය ආපසු ගෙවීමට අපොහොසත් වීම මත දිස්ත්‍රික් සංවිධානවල විවිධ ගැටලු පැන නැගී ඒවායේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය අඩාල විය. විපර්යකාරක වැඩසටහනට පරිබාහිර පුද්ගලයින් මේවායේ තනතුරු ලබා ගැනීම නිසා ක්‍රමවේදයේ හරයන් හා අභිමතාර්ථ ගිලිහී ගිය අතර, අද වනවිට දිස්ත්‍රික් සංගම්වල ක්‍රියාකාරී මට්ටමක් දක්නට නැත.

1978 වර්ෂයේ සිට 1998 වර්ෂය දක්වා විපර්යකාරක වැඩසටහනේ සංවර්ධනය සහ පරිපාලන කටයුතුවල ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය නිමග්නවී සිටි අතර, වැඩසටහන සඳහා ආධාරක ආයතනවල දායකත්වය 1998 වර්ෂයේ අවසන් වීමත් සමග, වැඩසටහනේ තිරසාරත්වය සඳහා කුඩා කණ්ඩායමේ සිට ජාතික මට්ටම දක්වා ස්වයං පරිපාලන සංවිධාන ව්‍යුහයක් යටතට ගැනීමට ආයතනයට අවශ්‍ය විය. එහෙත් ආයතනය විසින් සිදුකරනු ලැබූ කාර්යයක් අවිච්ඡින්න කිරිමේ අරමුණින් 1999 වර්ෂයේ දී ප්‍රජාශක්ති සංවිධානවල ඒකාබද්ධ සංවිධානයක් ලෙස ප්‍රජාශක්ති මහා සංගමය ආරම්භ කරන ලදී. එකී ජාතික සංවිධානයේ විධායක බලධරයා(පාලක ලේකම් තනතුර) ආයතනයේ අධ්‍යක්ෂ හෝ බලය පවරන ලද පුහුණුකරුවෙකු යටතට පත්වූ අතර, ඒ මගින් තවදුරටත් වැඩසටහනට අවශ්‍ය උපදේශකත්වය හා මානව සම්පත් සංවර්ධනය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට අවස්ථාව උදාවිය. වැඩසටහන යටතේ ආධාරක ආයතන මඟින් මානව සම්පත් සංවර්ධනයට ලබාදුන් රුපියල් මිලියන 5ක අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම මේ යටතට පැවරුණි. මහාසංගමය හා ආයතන අතර සම්බන්ධීකරණයෙන් ප්‍රජාශක්ති වැඩසටහනට අවශ්‍ය උපදේශකත්වය 2008 වර්ෂය වනතෙක් ආයතනය මගින් ලැබුණු අතර, එතැන් පටන් මහා සංගමය ආයතන සම්බන්ධීකරණයෙන් ගිලිහී යෑම නිසා ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සෘජු පාලනයෙන් නිදහස් වී ස්වාධීනව ගමන්කිරීමට ගත් වෑයම් උත්සායහ තවදුරටත් විපර්යකාරක වැඩසටහන දුර්වල වීමට හේතුවිය. මුදල් අවභාවිතය, විනිවිද බව නොමැතිවීම, දියුණු තත්ත්වයේ පවතින හබරාදූව වැලිගම වැනි සංවිධාන ප්‍රජා ශක්ති මහා සංගමයේ පරිපාලනය ප්‍රතික්ෂේප කිරීම, නිවරදි නායකත්වයක් හා කුසලතාවෙන් හෙබි කළමණාකාරීත්වයක් නොමැතිවීම මෙම අවධමනයට හේතු විය. ග්‍රාම

සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විපර්යකාරක වැඩසටහනින් ඉවත්වීම වැඩ සටහනේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක පිරිහීමට සෘජුවම බලපා ඇත.

ආරම්භක අවධිය තුළ ක්‍රමවේදය ගැලපීමේ ශක්තිමත් බව මත විවිධ අභියෝග මැද වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීමේ විභවතාවක් පැවතියත්, වර්තමානයේදි ප්‍රජාශක්ති සංවිධාන විපර්යකාරක ක්‍රමවේදයට අනුගතව ක්‍රියාත්මක වන බවට නිර්ණය කිරීමේ ශක්තිමත් සාක්ෂි නැත.

**ඇ. රාජ්‍ය යාන්ත්‍රණයට බද්ධ නොවීම.**

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන්කිරීම සඳහා ජාතික වශයෙන් ආරම්භ කරන ලද, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හා ජනසවිය වැඩසටහන සඳහා විපර්යකාරක වැඩසටහනේ අත්දැකීම් හා ක්‍රමවේදයේ හරයන් ගැළපීම තුළින් සාර්ථක කාර්යසාධනයක් හිමිකර ගනු ලැබුවත්, ඒවා තුළින් බිහිවී අදවන තෙක් අවිච්ඡින්නව ක්‍රියාත්මකවන ප්‍රජා බලවේගයක් හෝ සංවර්ධන වැඩසටහන් දක්නට නැත. විපර්යකාරක වැඩසටහන රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක සංවර්ධන උත්සාහයක් වුවත්, මෙම වැඩසටහන මූලික අභිමතාර්ථ ජාතික තලයට ගෙන ඒමට රජය පියවර ගෙන නැත. එතැන් පටන් සමෘද්ධි ව්‍යාපාරය වැනි දිළිඳුකම තුරන්කිරීම සඳහා රජය ආරම්භ කරනලද වැඩසටහන්වලට සහභාගීත්ව සංවර්ධන අපේක්ෂා ගලපාගැනීමට නාමික උත්සාහයක නිරත වුවත්, පසුකාලීනව එකී අපේකෂා අත්හැර ඇත. නමුත් සාම්ප්‍රදායික සංවර්ධනයට විකල්ප සංවර්ධන ප්‍රවේශයක් ලෙස පර්යේෂණාත්මකව ගොඩනගන ලද මෙම ක්‍රමවේදය ජාතික වැඩසටහන් සඳහා නොගැළපීම හා ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීමට පසුබටවීම මෙම වැඩසටහනට එල්ල වූ ප්‍රධාන අභියෝගයයි.

**අභියෝග ජය ගැනීම සඳහා නිර්දේශ**

- විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැඟී ඇති සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා චිරස්ථායි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුවත් වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය. ඒ සඳහා කුටුම්භ මට්ටම හා කුඩා කණ්ඩායම් මට්ටම තුළ සහභාගිත්ව විමර්ශන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රවීණ මැදිහත්කරුවන් පිරිසකගේ සේවය කඩිනමින් ලබා ගත යුතුය.

- දැනට ක්ෂේත්‍ර කටයුතුවලට සම්බන්ධ නිලධාරින් හා මැදිහත්කරුවන් විසින් ප්‍රජාවගේ විභවශක්තිය මතුකර ගැනීමට යත්න දැරීම තුළින් සංවර්ධන ක්‍රියාකාරකම් ගොඩනැඟීමට මග පෙන්විය යුතුය.

- ක්ෂේත්‍ර කටයුතුවල නිරත නිලධාරීන් හා ග්‍රාමීය සංවිධාන මැදිහත්කරුවන් අභිප්‍රේරණය සඳහා ප්‍රමාණවත් දීමනාවක් ගෙවීම තුළින් ඔවුන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම සුදුසුය. ඒ තුළින් පවතින සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට මැදිහත්කරුවාගේ පූර්ණ දායකත්වය ලබාගත යුතුය.

- ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත සාමාජිකයින්ගේ ගැටලුවලට සුදුසු විසඳුම් හඳුන්වා දීමට ප්‍රවීණ ව්‍යාපෘති නිලධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය වේ. දැනට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරතවී සිටින සාමාජිකයන්ගේ ගැටලු පිළිබඳ ගැඹුරින් සොයා බැලීම දුර්වල මට්ටමින් සිදු වන අතර, එකී අඩුපාඩු මඟ හැරවීමට කුසලතාවෙන් හෙබි පුද්ගලයින්ගේ සේවය කඩිනමින් ලබා ගත යුතුය. ස්වයං රැකියාවල නිරත සාමාජිකයන්ගේ නිෂ්පාදන හා අලෙවි ගැටලු විසඳීමේ වැඩසටහන්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවිය යුතුය.

- ❖ ග්‍රාමීය සංවිධානය ගොඩනැගීමට පෙර කුඩා කණ්ඩායම ආරම්භ කර ඒ තුළ සංවර්ධන ක්‍රියාවලිය පුළුල්වීමත් සමග ග්‍රාමීය සංවිධානයේ ගොඩනැගීමට මැදිහත්කරුවන්ට අවශ්‍ය මඟ පෙන්වීම කළ යුතුය.

- ❖ කුඩා කණ්ඩායම් තුළ රැස්වෙන මුදල් ආයෝජනයට දායක වන ලෙස ණය අරමුදල් තුළ තැන්පත් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

- ❖ ක්ෂේත්‍ර කටයුතුවල නිරත නිලධාරින් හා මැදිහත්කරුවන් හට විශාල කාර්යභාරයක නිරත වීමට සිදුවීම තුළින් සාමාජිකයාගේ විභව ශක්තිය පුබුදුවාලීමට අවශ්‍ය සමාජ සජීවිකරණ ක්‍රියාවලිය තුළ විවිධ අඩුපාඩු සිදුවේ. එහෙයින් එකී නිලධාරින් හට සහය වීම පිණිස ග්‍රාමීය සංවිධානවල නිලධාරීන්ගේ කුසලතාවන් වර්ධනය කර ඔවුන්ගේ සේවය ලබාගැනීට පියවර ගත යුතුය.

- ❖ කුඩා කණ්ඩායම් මගින් පවත්වාගෙන යනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට වැඩි මැදිහත්වීමක් අවශ්‍ය වේ. එසේ ම ශක්තිමත් කුඩා කණ්ඩායමක් පවත්වාගෙන යාමට අවශ්‍ය මඟපෙන්වීම ද නිතිපතා කළ යුතු වේ. එවිට කුඩා කණ්ඩායම් අක්‍රිය වීම හා සාමාජිකයින් විසිරයාම මඟ හැරේ.

- ❖ නව සාමාජිකයෙකු කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට නිසි ලෙස දායකත්වය දක්වන තුරු ඔහුට හෝ ඇයට ග්‍රාමීය සංවිධානයේ සාමාජිකත්වය පිරිනොනැමිය යුතුය.

- ❖ කුටුම්භ මට්ටමින් ප්‍රජාව මුහුණදෙන සමාජ මුහුණ දෙන සමාජ ආර්ථික ප්‍රශ්න හා ගැටලු සාකච්ඡා කිරීමටත් ඒවාට විසඳුම් හඳුනා ගැනීමටත් හැකි මැදිහත්වීමක් නිරන්තරයෙන් සිදු කිරීමෙන් අනතුරුව ඔවුන් වැඩසටහනට සම්බන්ධ කළ යුතුය.

- ❖ ණය ක්‍රියාවලිය තුළ පවතින සමහර ණය ක්‍රම වාණිජ බැංකු පොලියට වඩා ඉහළ ණය පොලියක් අය කරන අතර, ඒ වෙනුවට සාමාජිකයාට වාසි සහගත වන පරිදි තරගකාරී පොලී අනුපාත තීරණය කළ යුතුය.

- ❖ සාමාජික ණය ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට දක්වන දායකත්වයට සාපේක්ෂව අනෙකුත් සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම කෙරෙහි සැලකිලිමත් නොවන අතර ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය.

- ❖ ග්‍රාමීය සංවිධාන තුළ විධිමත් ණය ක්‍රියාවලියක් නොපවතින අතර, සාමාජිකයාගේ ආර්ථික සංවර්ධනයට හා ග්‍රාමීය සංවිධානයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහය වන පරිදි ග්‍රාමීය සංවිධාන තුළ විධිමත් ණය ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුය.

- ❖ දැනට අක්‍රිය තත්ත්වයේ පවතින ප්‍රජාශක්ති සංවිධාන, දිස්ත්‍රික් සංවිධාන හා මහ සංගමය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයක් සිදුකර ඒ තුලින් අනාවරණය කරගන්නා ගැටලු නිවාරණයට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සෘජු මැදිහත්වීම ලබාදිය යුතුය.

- ❖ විපර්යකාරක ක්‍රමවේදය වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයන්ට අනුගතවන පරිදි සංවර්ධනය කිරිමට ප්‍රජාශක්ති සංවිධාන, සමාජ විද්‍යාඥයින් හා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ එක්ව

කාර්යබද්ධ පර්යේෂණයක නිරත විය යුතු අතර, ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා ගැලපීමට එම යෝජනා ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කළ යුතුය.

- ප්‍රජාශක්ති මහසංගමය නැවත ආරම්භ කර එහි පරිපාලනය හා කළමනාකාරිත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය යටතට පවරාගත යුතු අතර, ඒ තුළින් විපර්යකාරක වැඩසටහන ශක්තිමත් කිරීමට හා පෝෂණය කිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදේශකත්වය ලබාදිය යුතුය.